# යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ සිදුව ඇති වෙනස්කම් පිළිබඳ සාරාංශය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

සැප්තැම්බර් 2020

CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දෘඩ විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

අංක 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව
දුරකථන:+94112081384,+94112081385,+94112081386
ෆැක්ස්: +94112081388
විද්‍යුත් තැපැල: info@cpalanka.org
වෙබ් අඩවිය: www.cpalanka.org
මුහුණුපොත :www.facebook.com/cpasl
ට්විටර්:@cpasl

# යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ සිදුව ඇති වෙනස්කම් පිළිබඳ සාරාංශය

ආණ්ඩුවේ විවිධ අංශයන් අතර බලතල බෙදීම පිළිබඳ ගතිකත්වයන් හි වෙනස්කම් ඇති කරමින් මෙන්ම වැඩි බලතල ප්‍රමාණයක් විධායක ජනාධිපති වරයා වෙත කේන්ද්‍රගත කරමින් යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ප්‍රධාන වෙනස්කම් ගණනාවක් ඇති කර තිබේ. මෙකී සංශෝධනය මගින් සිදුකර ඇති වෙනස්කම් ඔස්සේ නීති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට ද විවිධ වෙනස්කම් ඇති කරන්නා සේම ඒ මගින් නීති සම්මත කිරීමට පෙර ඒවා සමාලෝචනය කිරීම සඳහා පුරවැසියන්ට ඇති අවස්ථාවට සීමාවන් පැනවීම ඔස්සේ විනිවිදභාවය සහ වගවීම පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් ද උද්ගත වේ. තවද, 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථා සභාවේ සංයුතිය මෙන්ම බලතල ද වෙනස්කම්වලට ලක් කර ඇති අතර ඒ ඔස්සේ ස්වාධීන කොමිෂන් සභාවන්හි ස්වාධීනත්වය කෙරෙහි දැඩි අහිතකර බලපෑමක් උද්ගත වීමේ පැහැදිලි හැකියාවක් පවතී. කෙසේ වුවද, 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වාදෙන ලද අංගයන් ත්‍රිත්වයක් නොවෙනස්ව පවතී; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ ව්‍යවස්ථාව තුළින් හඳුන්වා දෙන ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම එලෙසම පවතී, විධායක ජනාධිපතිවරයාට එකී තනතුරු දැරීමේ වාර ගණන දෙවරක් වශයෙන් පවතින සීමාව (එකී සීමාව 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කරන ලද අතර එය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා නැවත වරක් හඳුන්වා දෙන ලද්දකි) සහ ජනාධිපති වරයාගේ සහ පාර්ලිමේන්තුවේ නිල කාලසීමාව වසර පහක් වශයෙන් පැවතීම (19 වන ආණ්ඩු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පෙර මෙකී ද්විත්වයෙහිම නිල කාලසීමාව වසර හයක් වශයෙන් පැවතුනි) ආදී වශයෙනි.

පහතින් ඉදිරිපත් කෙරෙනු ලබන වගුව ඔස්සේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අන්තර්ගතය පවතින ආකාරය සහ මේ වන විට යෝජනා වී ඇති 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සමග සංසන්දනාත්මක පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර තිබේ. මෙකී සංසන්දනාත්මක ඉදිරිපත් කිරීම සමඟ ඒ පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් පෙන්වාදෙනු ලබන මූලික අදහස් සහ නිරීක්ෂණයන් කිහිපයක් ද මේ තුළ අන්තර්ගත කර තිබේ.

| වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පවතින විධිවිධාන | 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ යෝජිත වෙනස්කම් | සංශෝධනයෙහි ප්‍රතිවිපාක / අදහස් |
|---|---|---|
| **ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව** | | |
| **35 වන ව්‍යවස්ථාව**<br><br>(1) යම් තැනැත්තකු ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා ලෙස ධූරය දරන අවස්ථාවක දී, ඔහු විසින් පෞද්ගලික තත්ත්වයෙහි ලාහෝ නිල තත්ත්වයෙහි ලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඔහුට | **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට 20 වන සංශෝධනයෙහි 5 වන වගන්ති මගින් පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-**<br><br>**35 වන ව්‍යවස්ථාව** | යෝජිත 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය අනුව පහත සඳහන් සීමිත අවස්ථාවන්හි දී හැර, ජනාධිපතිවරයා ඔහුගේ / ඇයගේ ධූර කාලය තුළ **සියලු නඩු කටයුතු පැවරීම හෝ පවත්වාගෙන යෑමෙන්** මුක්ත වේ. |

| | | |
|---|---|---|
| විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම හෝ නොකළ යුත්තේ ය :<br><br>**එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් ඔහුගේ නිලතත්වයෙහි ලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් නීතිපතිවරයාට විරුද්ධව 126 වන ව්‍යවස්ථාව යටතේ ඉල්ලීමක් කිරීමට යම් තැනැත්තකුට ඇති අයිතිය සීමා කරන ලෙස මේ අනුව්‍යවස්ථාවේ කිසිවක්, කියවා තේරුම් නොගත යුත්තේ ය :**<br><br>**එසේම තවදුරටත්, ජනාධිපතිවරයා විසින් 33 (2) (උ) ව්‍යවස්ථාව යටතේ බලතල ක්‍රියාත්මක කිරීම මත ප්‍රඥාපනය කිරීමට, ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.**<br><br>(2) කවර වූ හෝ තැනැත්තකුට විරුද්ධව, කවර හෝ විස්තරයක නඩුවක් පැවරිය හැකි කාලය සීමා කරමින් නීතියෙන් විධිවිධාන සකසා ඇති විට, ඒ තැනැත්තා යම් කිසි කාලයක් ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ධූරය දරා ඇත්නම් එකී නඩුව පැවරිය හැකි කාලසීමාව ලෙස නීතියෙන් නියමව ඇති කාලය නිශ්චය කිරීමේ දී ඒ තැනැත්තා ජනාධිපති ධූරය දැරූ කාලය නොගැනිය යුත්තේ ය.<br><br>(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධානවලින් පැවරී ඇති මුක්තිය, 129 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ හෝ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හා සම්බන්ධව හෝ ජනමත විචාරණයක වලංගුභාවය හා සම්බන්ධව 130 වන ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ අදාළ නොවන්නේ ය. | 1) ජනාධිපතිවරයා ලෙස ධූරය දරන කවර වූ හෝ තැනැත්තකු විසින් පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ නිල තත්ත්වයෙහි ලා හෝ කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක කිසිම නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුත්තේ ය.<br><br>(2) කවර වූ හෝ තැනැත්තකුට විරුද්ධව නඩු පැවරීමේ දී නඩු පැවරිය හැකි කාලසීමාව නීතියෙන් නියම වී ඇති විට, ඒ කාලසීමාව තුළ ඒ තැනැත්තා යම් කිසි කාලයක් ජනාධිපති ධූරය දරා ඇත්නම් එකී නඩුව පැවරිය හැකි කාලසීමාව ඉකුත් වූයේ ද යන වග නිශ්චය කිරීමේ දී ඔහු ජනාධිපති ධූරය දැරූ කාලය නොගැනිය යුත්තේ ය.<br><br>(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන වලින් පැවරී ඇති මුක්තිය, ජනාධිපතිවරයාට පවරා ඇති නැතහොත් 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ ඔහුගේ භාරයේ තිබෙන යම් විෂයයකට හෝ කාර්යයකට සම්බන්ධ යම් බලයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව කවර වූ හෝ අධිකරණයක පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ 129 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම හා සම්බන්ධව හෝ ජනමත විචාරණයක වලංගුභාවය සම්බන්ධව 130 වන ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ 144 වන ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීම හා සම්බන්ධව නැතහොත් ජනමත විචාරණයකවලංගුභාවය සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ අදාළ නොවන්නේ ය:<br><br>එසේ වුව ද, එවැනි යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව එවැනි යම් නඩු කටයුත්තක් නීතිපතිවරයාට විරුද්ධව පැවරිය යුත්තේ ය.”. | අ) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයකුගේ ධාරිතාවයෙන් ඔහු හෝ ඇය විසින් සිදු කරන ක්‍රියා<br>ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව සිදුවන දෝෂාභියෝග කාර්ය පටිපාටිය<br>ඇ) ජනාධිපතිවරණ මැතිවරණයක හෝ ජනමත විචාරණයක වලංගුතාවය සම්බන්ධයෙන් වන මැතිවරණ පෙත්සම්<br>ඈ) ආණ්ඩඅක්‍රම ව්‍යවස්ථාවේ 144 ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය තුළ පවතින කාර්ය පටිපාටිය හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පත්කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින කටයුත්තකදී<br><br>වර්තමානයේ පවතින විධිවිධානය හරහා ජනාධිපතිවරයාට හිමිවන්නේ සිවිල් සහ අපරාධ නීති කටයුතුවලින් නෛතික මුක්තියක් පමණි.<br><br>තවද පවතින විධිවිධාන තුළින් ප්‍රකාශිතවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාව අනුව මූලික අයිතිවාසිකම් නඩුකර පවත්වාගෙන යෑම සඳහා පුරවැසියන්ට අයිතිවාසිකම්ක් ලබාදී ඇති අතර එකී තත්ත්වය යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කෙරේ. |

| ජනාධිපතිවරයාගේ බලතල හා කාර්ය | | |
|---|---|---|
| **33 (1) ව්‍යවස්ථාව** ජනාධිපතිවරයාගේ කාර්යය විය යුත්තේ :-<br>(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද, ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම;<br>(ආ) ජාතික ප්‍රතිසන්ධානය හා ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම;<br>(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ VIIඅ ව්‍යවස්ථාවේ සඳහන් ආයතනවල නිසි ක්‍රියාකාරීත්වය පහසුකරලීම; සහ<br>(ඈ) මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණ නිර්මාණය කිරීම තහවුරු කිරීම, වන්නේ ය.".<br><br>**33. (2) (ඇ) ව්‍යවස්ථාව** අනුව පාර්ලිමේන්තුව කැඳවීමට, වාර අවසන් කිරීමට සහ විසුරුවා හැරීමට බලය ජනාධිපතිවරයා පවරා ඇත | **යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි 3 වන ඡේදය මගින් 33 (1) සහ 33 (2) (ඇ) යන ව්‍යවස්ථාවන් ඉවත් කර තිබේ** | |
| **33අ ව්‍යවස්ථාව.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිය ඇතුළු යම් ලිඛිත නීතියක් යටතේ ද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ යථා පරිදි ඉටුකිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිවයුත්තේ ය. | **යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි 4 වන වගන්තිය මගින් 33 අ ව්‍යවස්ථාවන් ඉවත් කර තිබේ. කෙසේනමුත් මෙම ව්‍යවස්ථාව 20 වන සංශෝධනයෙහි විධායකය යටතේ ඇති 7 වන වගන්තිය මගින් ඇතුලත් කරතිබේ. (යෝජිත සංශෝධනයෙහි 42 වන ව්‍යවස්ථාව)** | |
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙනුවට පාර්ලිමේන්තු සභාව ආදේශ කිරීම** | | |
| **41 අ ව්‍යවස්ථාව**<br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාව ස්වකීය නිල බලයෙන් පත්වන කථානායක, අග්‍රාමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන සාමාජිකයන් **<u>තිදෙනෙකුගෙන්</u>** සමන්විත වේ.<br><br>***[41 අ ව්‍යවස්ථාව (1)(අ),(ආ) සහ (ඇ)]***<br><br>පාර්ලිමේන්තුවේ අනෙකුත් **<u>සාමාජිකයන් සිව්දෙනා</u>;** | **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය 20 වන සංශෝධනයෙහ් 6 වන වගන්තිය මගින් ඉවත් කරනු ලබන අතර, ව්‍යවස්ථාදායක සභාව වෙනුවට පාර්ලිමේන්තු සභාව ආදේශ කරනු ලැබේ.**<br><br>**41 අ ව්‍යවස්ථාව**<br>පාර්ලිමේන්තු සභාව -<br>(අ) අග්‍රාමාත්‍යවරයා<br>(ආ) කථානායකවරයා | යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ඇති කර ඇති පාර්ලිමේන්තු සභාව පාර්ලිමේන්තුවෙහි සාමාජිකයන් ගෙන් **<u>පමණක්</u>** සමන්විත වේ.<br>පාර්ලිමේන්තු සභාවට පත් කෙරෙනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මූලික බැඳීම් පවතින්නේ ආණ්ඩුවට හෝ ප්‍රධාන විපක්ෂයටය. |

| | | |
|---|---|---|
| ➢ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු **එක්** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ***[41 අ ව්‍යවස්ථාව (1)(ඈ) ]***<br>➢ අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාගේ ම නාම යෝජනා කිරීම මත පත් කරනු ලැබිය යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් **දෙදෙනෙක්** ***[41 අ ව්‍යවස්ථාව (1)(ඉ) ]***<br>➢ පාර්ලිමේන්තුවේ නියෝජනය ඇති අනෙකුත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාම යෝජනා කරනු ලැබිය යුතු **එක්** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ***[41 අ ව්‍යවස්ථාව (1)(ඊ) ]***<br>**අනෙක් තැනැත්තන් තිදෙනා විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන් යුත්, පොදු වෘත්තීය ජීවිතයේ දී කීර්තිය ලත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන තැනැත්තන්** විය යුතු අතර ඔවුන් නම් කරනු ලැබීම අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් කලයුතුය.<br><br>අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් මෙකී නම් කිරීම් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය.<br>***[ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ (1)(ඉ) සහ 41 අ (5) ]***<br><br>41 අ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදය යටතේ පත් කරනු ලබන්නා වූ තැනැත්තන් පස් දෙනා (එනම්, පාර්ලිමේන්තු මංත්‍රීවරුන් දෙදෙනා සහ **විශිෂ්ටත්වයෙන් යුත් ස්වාධීන තැනැත්තන්**) නම් කිරීමේ දී අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් වෘත්තීය සහ සමාජීය විවිධත්වය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් පිළිබිඹුවන බව සහතික වීම පිණිස, පාර්ලිමේන්තුවේ නියෝජනය වන දේශපාලන පක්‍ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන් විමසිය යුත්තේ ය.<br>***[ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (4) ]*** | (ඇ) විරුද්ධ පක්ෂයේ නායකවරයා<br><br>(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයකු සහ<br><br>(ඉ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයකු, යන අයගෙන් සමන්විත (මෙහි මින්මතු,සභාව, යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු සභාවක නිරීක්ෂණ ඉල්ලා සිටීම කළ යුත්තේ ය<br><br>එසේ වුව ද, ඉහත (ඈ) සහ (ඉ) ඡේද ප්‍රකාර පත්කරනු ලබන තැනැත්තන් ඉහත (අ), (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව සඳහන් තැනැත්තන් අයත් වන ජන කොට්ඨාස නොවන්නා වූ ජන කොට්ඨාසවලට අයත්වන නාමිකයන් බව සහතික වන ආකාරයට නම් කළ යුත්තේ ය. | පාර්ලිමේන්තුව නියෝජනය කරන අනෙකුත් දේශපාලන පක්ෂයන්හි නියෝජනයක් එහි නොමැත.<br><br>**දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන සමාජීය පිළිගැනීමක් ඇති සහ වෘත්තීය ජීවිතයේ කීර්තිය ලත්** තැනැත්තන් පත් කිරීම සඳහා විධිවිධානයක් නොමැත.<br><br>ශ්‍රී ලංකාවේ බහුත්ත්ව ලක්ෂණයපිළිබඳ හඳුනා ගැනීමක් නොමැති සේම ප්‍රධාන තනතුරු සඳහා පත් කිරීම් සිදු කිරීමේදී විවිධ අදහස් සැලකිල්ලට භාජනය කිරීමේ අවශ්‍යතාවය ද හඳුනාගෙන නොමැත. |

| | | |
|---|---|---|
| **ව්‍යවස්ථාදායක සභාවේ කාලය**<br><br>**41අ ව්‍යවස්ථාව**<br><br>(7) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු කථානායකවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා තෙක්, ඒ දක්වා සිටි කථානායකවරයා සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් ධූරය දැරිය යුත්තේ ය...<br><br>(ආ) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, අග්‍රාමාත්‍යවරයා, විරුද්ධ පක්ෂයේ නායකවරයා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකී විසුරුවාහැරීමට පසුව පවත්වනු ලබන මහමැතිවරණයට ඉක්බිතිව අවස්ථාවෝචිත පරිදි අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලබන තෙක් හෝ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස පිළිගනු ලබන තෙක් හෝ යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් (1) වන අනු ව්‍යවස්ථාවේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේද යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලබන තෙක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් ලෙස තවදුරටත් ධූර දැරිය යුත්තාහ.<br><br>(8) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඈ) ඡේදය, (ඉ) ඡේදය සහ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සෑම සාමාජිකයකු ම විසින්, **ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් ඔහුගේ ධූරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ඔහුට තම ධූරයේ කටයුතු තවදුරටත් කරගෙන යාමට නොහැකි ශාරීරික හෝ මානසික අශක්නුතාවයකට පත්ව ඇති බවට අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාම** මතයක් ඇති කර ගන්නා අවස්ථාවක ඒ මත ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන | **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය 20 වන සංශෝධනයෙන් 6 වන වගන්තිය මගින් ඉවත් කරනු ලබයි**<br><br>පාර්ලිමේන්තු සභාවේ කාලය - **6 වන** ඡේදයෙහි 41 (අ) ව්‍යවස්ථාව<br><br>(4) 64 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු කථානායකවරයා ලෙස තෝරා පත්කර ගනු ලබන තෙක්, කථානායකවරයා මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා කථානායකවරයා ලෙස නොකඩවා කටයුතු කළ යුත්තේ ය.<br><br>(5) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, ඉන් ඉක්බිතිව පවත්වනු ලබන මහ මැතිවරණයකින් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා ලෙස පිළිගනු ලබන තෙක් විරුද්ධ පක්ෂයේ නායකවරයා, මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා විරුද්ධ පක්ෂයේ නායකවරයා ලෙස නොකඩවා ධූරය දැරිය යුත්තේ ය.<br><br>(6) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, ඉන් ඉක්බිතිව පවත්වනු ලබන මහ මැතිවරණයකින් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට තෝරා පත්කරගනු ලබන තෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වූ, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයා සභාවේ සාමාජිකයන් ලෙස නොකඩවා කටයුතු කළ යුත්තා හ.<br>(7) මේ ව්‍යවස්ථාව යටතේ සංස්ථාපිත සභාවේ නිල කාලය 62 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් යම් කාලයක් සඳහා දීර්ඝ විය යුත්තේ ය. තව ද, එම නිල කාලය කෙරෙහි, 70 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමක් මගින් බලපෑමක් ඇති නොවිය යුත්තේ ය<br><br>එසේ වුව ද, **ජනාධිපතිවරයා විසින්** එකී නිල කාලය තුළ දී පිළිවෙලින් අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් නාමිකයන් ලෙස පත් කරනු ලැබූ තැනැත්තන් **ඉවත් කිරීම හෝ** එකී නාමිකයකුගේ අශක්නුතාවක් ඇති අවස්ථාවක, ඔහුගේ නාමිකයා ලෙස | යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අග්‍රාමාත්‍යවරයාව ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට ලබා දී තිබේ **(6 වන වගන්තියෙහි 47 (අ) ව්‍යවස්ථාව)**.<br><br>යෝජිත සංශෝධනය මගින් අග්‍රාමාත්‍යවරයා සහ විපක්ෂ නායකනායකවරයා විසින් යෝජනා කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනා ඕනෑම අවස්ථාවකදී ඕනෑම හේතුවක් පදනම් කරගනිමින් ඉවත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට ලබා දී තිබේ. |

| | | |
|---|---|---|
| <u>ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ 41ඉ ව්‍යවස්ථාවේ (7) වන අනු ව්‍යවස්ථාව යටතේ ඔහු සිය ධූරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුත්තේ ය.</u> | වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් කරන ලෙස ජනාධිපතිවරයා විසින් අවස්ථාවෝචිත පරිදි, අග්‍රාමාත්‍යවරයාට හෝ විරුද්ධ පක්ෂයේ නායකවරයාට <u>**නියම කිරීම**</u> හෝ කරනු ලැබිය හැක්කේ ය. | |
| **පාර්ලිමේන්තු සභාව සතු සීමිත බලපෑම් කිරීමේ හැකියාව** | | |
| **41ආ (1) ව්‍යවස්ථාව**<br><br>පහත සඳහන් කොමිෂන් සභාවල සාමාජිකයන් පත් කළ හැක්කේ <u>**ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත**</u> <u>පමණි</u>. එම කොමිෂන් සභා වන්නේ: -<br><br>මැතිවරණ කොමිෂන් සභාව;<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව;<br>ජාතික පොලිස් කොමිෂන් සභාව;<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන්සභාව;<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව;<br>මැතිවරණ කොමිෂන් සභාව;<br>සීමා නිර්ණය කොමිෂන් සභාව;<br>ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.<br>විගණන සේවා කොමිෂන් සභාව.<br><br>**41ආ (3) ව්‍යවස්ථාව**<br>ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් සම්බන්ධයෙන් වන විට, පත් කිරීම සඳහා සභාව විසින් තැනැත්තන් තිදෙනෙකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර, නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය. | **20 වන සංශෝධනයේ 6 වන වගන්තිය, 41 (අ) ව්‍යවස්ථාව**<br><br>(1) මේ ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් ද, මේ ව්‍යවස්ථාවේ II වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් ධූරවලට පත්කළ යුතු තැනැත්තන් ද, ජනාධිපතිවරයා විසින් ඒ කොමිෂන් සභාවලට සහ ධූරවලට පත්කරනු ලැබිය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් එකී පත්කිරීම් සිදුකිරීමේ දීපාර්ලිමේන්තු <u>**සභාවක නිරීක්ෂණ ඉල්ලා සිටීම**</u> කළ යුත්තේ ය.<br><br>I වන උපලේඛනය<br><br>1. මැතිවරණ කොමිෂන් සභාව.<br>2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.<br>3. ජාතික පොලිස් කොමිෂන් සභාව.<br>4. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.<br>5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව.<br>6. මුදල් කොමිෂන් සභාව.<br>7. සීමා නිර්ණය කොමිෂන් සභාව.<br><br>II වන උපලේඛනය<br><br>I වන කොටස<br>1. අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්.<br>2. අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ විනිශ්චයකාරවරුන්. | වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ගත් කල, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරණයන් තුළින් ජනාධිපතිවරයා බැඳීමට ලක් වෙයි.<br><br>ඊට ප්‍රතිවිරුද්ධව බලන විට, පාර්ලිමේන්තු සභාව විසින් නිරීක්ෂණයන් පමණ සිදු කෙරේ. ජනාධිපතිවරයාට ඔවුන් වෙත කිසිදු බැඳීමක් නොමැති අතර ඔහුට හෝ ඇයට නිරීක්ෂණයන් ඉල්ලා සිටීම පමණක් සිදු කළ හැක. එකී නිරීක්ෂණයන් සලකා බැලීම් සඳහා වුවද ජනාධිපතිවරයා වගකීමෙන් බැඳීමේ තත්ත්වයක් ඇති නොවේ.<br><br>එමනිසා සන්සංදනාත්මකව බැලීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සාපේක්ෂව පාර්ලිමේන්තු සභාව බොහෝ සෙයින් දුර්වල ව්‍යුහයක් බව පෙන්නුම් කෙරේ.<br><br>රාජ්‍ය සේවයෙහි ප්‍රධාන තනතුරු සඳහා පත් කිරීම සිදු කිරීමට ජනාධිපතිවරයාට ඇති බලතල අසීමිතය.<br><br>ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කර තිබේ. **(20 වන සංශෝධනයේ 57 (4) වන වගන්තිය බලන්න.)** |

| | | |
|---|---|---|
| **41ආ (5) ව්‍යවස්ථාව**<br>මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන යම් තැනැත්තකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයාගේ හෝ සාමාජිකයකුගේ වැඩ බැලීම සඳහා පත් කරනු ලබන තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුතු අතර එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවක දී ඒ තැනැත්තා **සභාවේ පූර්ව අනුමතය ඇතිව පමණක්** ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේ ය.<br><br>**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව**<br><br>පහත තනතුරු සඳහා **ජනාධිපතිවරයා විසින් සිදු කරන නාම යෝජනා අනුමත කිරීමේ** බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඇත. එනම්: -<br><br>➢ අග්‍රවිනිශ්චයකාරවරයා<br>➢ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්;<br>➢ අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්;<br>➢ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්.<br>➢ නීතිපතිවරයා;<br>➢ විගණකාධිපතිවරයා;<br>➢ පොලිස්පතිවරයා;<br>➢ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්);<br>➢ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා. | 3. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.<br>II වන කොටස<br>1. නීතිපතිවරයා.<br>2. විගණකාධිපතිවරයා.<br>3. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්).<br>4. පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා.<br><br>(10) මේ ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු, හෝ මේ ව්‍යවස්ථාවේ II වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් ධුරවලට පත් කරනු ලැබූ යම් තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හෝ එකී කාර්යය සඳහා පනවන ලද වෙනත් යම් නීතියකින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට හෝ හැර ඉවත් නොකළ යුත්තේ ය. **එවැනි විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක එකී තැනැත්තා ජනාධිපතිවරයා විසින් ඉවත් කළ යුත්තේ ය.** | සිදු කරනු ලැබූ පත් කිරීම් ඉවත් කිරීම් සම්බන්ධයෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් ලිඛිත නීතියක කිසිදු ක්‍රියා පටිපාටියක් සඳහන්ව නොමැති කල්හි;<br><br>➢ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ආණ්ඩුකුම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය සහිතව එවන් තැන්ත්තෙකු ඉවත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට පවතී.<br><br>➢ යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව බලන කල, එවන් තත්ත්වයක දී පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ලබා ගැනීමකින් තොරව පවා එවන් තැන්ත්තෙකු ඉවත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයා ගේ කැමැත්ත පරිදි සිදු කළ හැක.<br><br>යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන අනුව 42අ ව්‍යවස්ථාව යටතේ ඇති I සහ II යන උප ලේඛනයන්හි පෙන්වා දෙන නිලධරයන්ගේ ලයිස්තුවෙන් පොලිස්පතිවරයාගේ තනතුර ඉවත් කර ඇත. ඒ අනුව බලන කල, පොලිස්පති වරයාව පත් කිරීම සම්බන්ධයෙන් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් සලසා නොමැතිකම එකී පත්කිරීමට අදාළ අඩුපාඩුවක් උද්ගත කිරීමට හේතු වී ඇත.<br><br>**පහත සඳහන් පත්කිරීම් සම්බන්ධයෙන් අන්තර්කාලීන විධිවිධාන සලසා නොමැත;**<br><br>- තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>- අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳව කාර්යාලය<br>- හානිපූරණය සඳහා වන කාර්යාලය |

| | | |
| --- | --- | --- |
| **41ඇ (3) ව්‍යවස්ථාව**<br><br>මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ ධූරයකට පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු හෝ ඒ ධූරයකට පත් කරන ලද තැනැත්තකු වෙනුවෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියකින් හෝ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එකී ධූරයෙන් ඉවත් කරනු නොලැබිය යුත්තේ ය. | | මෙම ආයතන සඳහා පත්කිරීම්කිරීම් සිදුකිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශයන් අවශ්‍ය බව ඒ ඒ ආයතනයන්ට අදාල පනත් තුලින් ම පෙන්වා දෙනු ලැබේ.<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීමේ තත්ත්වය තුළ සහ පත්කිරීම් සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා බලයක් පාර්ලිමේන්තු සභාවට නොමැති පසුබිමක, ඉහත කී ඒ ඒ පනත් සඳහා වෙන වෙනම සංශෝධනයන් ගෙන ඒමේ අවශ්‍යතාව ඉස්මතු වේ.<br><br>මෙවැනි තත්ත්වයක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම සඳහා විධිවිධාන සලසා නොමැති මෙවැනි පසුබිමක, ඒ ඒ පනත් සඳහා සංශෝධනයන් ද නොමැති තත්ත්වයක් යටතේ ඉහත කී කොමිෂන් සභාවන් අක්‍රීය තත්ත්වයට පත්වීමේ හැකියාවක් පවතී. |
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ (4) සහ (5) ව්‍යවස්ථාව**<br><br>සභාව විසින් කරනු ලැබිය යුතු සෑම නිර්දේශයක් හෝ අනුමත කිරීමක් ද ගනු ලබන සෑම තීරණයක් ද ඒකමතිකව තීරණය කිරීමට සභාව විසින් උත්සාහ දරනු ලැබිය යුතු ය. ඒකමතික තීරණයක් ගත නොහැකි අවස්ථාවක දී සභාවේ රැස්වීමට පැමිණ සිටින <u>**සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක්**</u> විසින් සනාථ කළහොත් මිස, සභාව විසින් කරන ලද යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ ගනු ලැබූ යම් තීරණයක් හෝ බලසහිත නොවිය යුතු ය. (රැස්වීමේ සභාපතිත්වය දරන සාමාජිකයාට මුල් ඡන්දයක් නොමැති නමුත්, සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ තීරණයක් සඳහා සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවකදී තීරක ඡන්දයක් පමණක් හිමි වේ.)<br>**41ඉ (3) ව්‍යවස්ථාව**<br>සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය. | **6 වන වගන්තියේ, 41අ (8) ව්‍යවස්ථාව**<br><br>(අ) ජනාධිපතිවරයා විසින් (1) වන අනුව්‍යවස්ථාව යටතේ සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී, තමන් විසින් එකී පත්වීම් සඳහා යෝජනා කරනු ලැබූ තැනැත්තන් පිළිබඳ සභාවේ නිරීක්ෂණ, එකී නිරීක්ෂණ ඉල්ලා සිටීමේ දින සිට සතියක කාලපරිච්ඡේදයක් තුළ කථානායකවරයා මඟින් තමන්ට එවන ලෙස සභාවට නියම කරනු ලැබිය යුත්තේ ය.<br>(ආ) සභාව විසින් එහි නිරීක්ෂණ (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලය තුළ දැන්වීම පැහැර හැරියහොත්, ජනාධිපතිවරයා විසින් වහාම එකී පත්වීම් සිදු කිරීමට කටයුතු කළ යුත්තේ ය.<br><br>**6 වන වගන්තියේ, 41අ (11) ව්‍යවස්ථාව**<br>සභාවේ නිරීක්ෂණ ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය කථානායකවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය. | ව්‍යවස්ථා සභාව ඒකමතික තීන්දු ගැනීම සඳහා සියලු උත්සාහයන් දැරිය යුතු අතර එවැනි අවශ්‍යතාවයක් පාර්ලිමේන්තු සභාව සම්බන්ධයෙන් ඇති කර නැත.<br><br>ඒකමඒකමතික තීන්දුවක් නොමැති අවස්ථාවන්හිදී ව්‍යවස්ථා සභාවේ තීරණයක් සඳහා අවම වශයෙන් එහි සාමාජිකයන් පස් දෙනෙකුගෙන් එකගත්වය පැවතිය යුතු වේ. පාර්ලිමේන්තු සභාව සම්බන්ධයෙන් ගත් කල එවන් අවශ්‍යතාවයක් පෙන්වාදී නොමැත.<br><br>ව්‍යවස්ථා සභාවේ රැස්වීමේ සභාපතිත්වය දරන සාමාජිකයාට මුල් ඡන්දයක් නොමැත.<br><br>පාර්ලිමේන්තු සභාවේ රැස්වීම් සඳහා සන පූර්ණයක් පෙන්වා දී නොමැති අතර ඕනෑම සාමාජිකයන් ගණනකට රැස්වී නිරීක්ෂණයක් ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී. |

## කැබිනට් අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ බලතල වැඩිවීම

**අමාත්‍යවරයන් සහ ඔවුන්ගේ විෂය සහ කාර්ය.**
**43 ව්‍යවස්ථාව**

(1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍යයැයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව ද අමාත්‍යාංශ සංඛ්‍යාව ද ඒ අමාත්‍යවරයන්ට පවරන විෂය සහ කාර්ය ද නිශ්චය කළ යුත්තේ ය.

(2) ජනාධිපතිවරයා විසින් එසේ නිශ්චය කරනු ලබන අමාත්‍යාංශ භාරව කටයුතු කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් අතුරෙන් අමාත්‍යවරයන් පත් කළ යුත්තේ ය.

(3) ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවක දී වුව ද, අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම ද කරනු ලැබිය හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ පැවැත්මට එවැනි වෙනස් කිරීමක් බල නොපාන්නේ ය.

**19 වන සංශෝධනයෙහි අන්තර්කාලීන විධිවිධානයන්**

**19 වන සංශෝධන පනතෙහි 51 වගන්තිය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි කවර කරුනක් සඳහන් වුවද, මෙම පනත ආරම්භ කළ දිනයේ සිට ජනාධිපති ධුරය හෙබවූ තැනැත්තා, ඔහු ජනාධිපති ධුරය දරන තාක් කල්, ආරක්ෂක, මහවැලි සංවර්ධනය හා පරිසරය යන විෂයයන් සහ කාර්යයන් තමාටම පවරාගැනීම තීරණය කළ හැකි අතර එවැනි අමාත්‍යාංශයක් සම්බන්ධයෙන් අදාල කිසියම් විෂයයක් හෝ කාර්යයක් පවරා ඇති අමාත්‍යවරයා වෙත ලිඛිත නීතියක කිසියම් සඳහනක් ඇත්නම් එවැන්නක් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් වන කරුණක් බවට සැලකිය යුතුය.

**අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සහ ඔවුන්ගේ විෂය සහ කාර්ය.**
**44 ව්‍යවස්ථාව**

(1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින් කලින් කල -

(අ) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද අමාත්‍යාංශ සංඛ්‍යාව ද ඒ අමාත්‍යවරයන්ට පවරන විෂය සහ කාර්ය ද නිශ්චය කළ යුත්තේ ය. තවද

(ආ) එසේ නිශ්චය කරනු ලබන අමාත්‍යාංශ භාරව කටයුතු කිරීම සඳහා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් අමාත්‍යවරයන් පත් කළ යුත්තේ ය.

(2) ජනාධිපතිවරයා විසින් යම් විෂයයක් හෝ කාර්යයක් තමාට ම පවරා ගැනීම කළ හැකි අතර මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ හෝ 45 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ හෝ යම් අමාත්‍යවරයකුට පවරනු නොලැබූ යම්කිසි විෂයයක් හෝ කාර්යයක් භාරව සිටිය යුත්තේ ය. තත් කාර්ය සඳහා තමා භාරයේ තිබිය යුතු අමාත්‍යාංශ සංඛ්‍යාව නිශ්චය කිරීම ද කළ හැක්කේ ය. ඒ අනුව, ඒ විෂයය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම්කිසි ලිඛිත නීතියක හෝ ඇති සඳහනක් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුත්තේ ය.

(3) ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවක දී වුව ද, අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම ද කරනු ලැබිය හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ පැවැත්මට එවැනි වෙනස් කිරීමක් බලනොපාන්නේ ය.

වර්තමානයේ පවතින ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ සහ යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ජනාධිපතිවරයා **විසින් අගමැතිවරයාගේ අදහස් විමසීම් කළ යුතු යැයි කල්පනා කරන කල්හි** එසේ සිදුකර අමාත්‍යාංශ සංඛ්‍යාව සහ ඒවා සඳහා වන විෂයයන් සහ කාර්ය කර්තව්‍යයන් තීරණය කිරීම ජනාධිපතිවරයා විසින් කරනු ලැබිය හැක.

කෙසේ නමුත්, වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් අමාත්‍යවරුන් ලෙස පත්කරනු ලබන්නේ කවුරුන්ද යන්න තීරණය කිරීමේ දී ජනාධිපතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් අගමැතිවරයාගේ උපදෙස් ලබාගත **යුතුය**. යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් අගමැතිවරයාගේ අදහස් විමසීම් අවශ්‍යතාවයක් පෙන්වා දී නොමැත.
මෙහිදී දැකිය හැකි එක් සුවිශේෂී වෙනස්කමක් වන්නේ වර්තමාන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට අමාත්‍යාංශයක් වෙන්කර ගැනීම සඳහා විධිවිධානයක් පෙන්වා දී නොමැතිකම ය. (ඒ සම්බන්ධයෙන් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ සීමිත අන්තර්කාලීන ප්‍රතිපාදනයක් පැවති අතර වර්තමාන ජනාධිපතිවරයා පත් වීමෙන් පසු එකී ප්‍රතිපාදනය අදාල වීම් නතර විය.)

යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ඕනෑම විෂයක් කර්තව්‍යයක් ජනාධිපතිවරයා වෙත පවරා

| | | |
|---|---|---|
| | | ගැනීමේ හැකියාව ඇති සේම ඊට අමතරව කිසිදු අමාත්‍යවරයෙකුට පවරා දී නොමැති ඕනෑම විෂයක් හෝ කර්තව්‍යයක් සම්බන්ධයෙන් බලතල තබා ගැනීමේ හැකියාව ද එලෙසම ජනාධිපතිවරයා වෙත පවතී. |
| **අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්.**<br><br>**44 ව්‍යවස්ථාව**<br>(1) ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පාර්ලිමේන්තුවේ මන්ත්‍රිවරයන් අතුරෙන් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය.<br><br>(2) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යැයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය ද ඔවුන්ට යම් අමාත්‍යාංශ භාර කරන්නේ නම් ඒ අමාත්‍යාංශ ද නිශ්චය කරනු ලැබිය හැක්කේ ය.<br><br>(3) ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ කරන යම් භාර කිරීමක් කවර වූ හෝ විටක වෙනස් කරනු ලැබිය හැක්කේ ය.<br><br>(4) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන සෑම අමාත්‍යවරයෙක්ම අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටින්නේ ය.<br><br>(5) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු විසින් ඔහු වෙත පැවරී ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් හෝ යම් කිසි ලිඛිත නීතියකින් ඔහුට පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට පවරා දිය හැකි අතර අමාත්‍ය | **අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්, ඔවුන්ගේ අමාත්‍යාංශ, විෂය සහ කාර්ය.**<br><br>**45 ව්‍යවස්ථාව**<br>(1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින් කලින් කල -<br><br>(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය. තවද<br><br>(ආ) ඒ අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය ද ඔවුන්ට යම් අමාත්‍යාංශ භාර කරනු ලබන්නේ නම් ඒ අමාත්‍යාංශ ද නිශ්චය කළ හැක්කේ ය.<br><br>(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ කරන ලද යම් පත් කිරීමක් හෝ විෂය සහ කාර්ය පැවරීමක් ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවක දී වුව ද වෙනස් කරනු ලැබිය හැක්කේ ය.<br><br>(3) මේ ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද සෑම අමාත්‍යවරයෙක්ම අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට වගකීමට සහ උත්තර දීමට බැඳී සිටින්නේ ය.<br><br>(4) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු වෙත පැවරී ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම්කිසි බලයක් හෝ කාර්යයක් හෝ යම්කිසි ලිඛිත නීතියකින් පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම්කිසි බලයක් හෝ කාර්යයක් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට පවරා දිය හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ ඒ අමාත්‍යවරයාට ඒ | වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කැබිනට් නොවන අමාත්‍යවරයන් පත්කිරීමේදී අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාට ක්‍රියා කිරීමට සිදුවේ. යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් **අගමැතිවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවන් හිදී පමණක්** එසේ සිදු කළ හැකිය.<br><br>වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විෂය කරුණු සහ කාර්ය කර්තව්‍යයන් පැවරීම වෙනස් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට ඇති නමුදු යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ කැබිනට් නොවන අමාත්‍යවරුන් වෙනස් කිරීමේ හැකියාව ද ජනාධිපතිවරයා සතුවේ.<br><br>වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කැබිනට් නොවන අමාත්‍යවරුන් වගකිව යුතු වන්නේ කැබිනට් ඇමැතිවරුන්ට සහ පාර්ලිමේන්තුවට පමණක් වුවද යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ඔවුන් කැබිනට් මණ්ඩලයට මෙන්ම පාර්ලිමේන්තුවට ද **වගකිව යුතු සේම වග උත්තර බැඳිය යුතුය.** |

| | | |
|---|---|---|
| මණ්ඩලයේ අමාත්‍යවරයාට එකී බලතල කිසිවක් හෝ කාර්යයක් පවරන්නා වූ හෝ නියම කරන්නාවූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද මේ අනු ව්‍යවස්ථාව යටතේ එකී වෙනත් අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය. | බලය හෝ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, මේ අනුව්‍යවස්ථාව යටතේ එකී වෙනත් අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ යම්කිසි බලයක් හෝ කාර්යයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යනුකූල වන්නේ ය. | |
| **නියෝජ්‍ය අමාත්‍යවරයන්**<br><br>**45 ව්‍යවස්ථාව**<br>(1) ජනාධිපතිවරයා විසින්, අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ට ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමෙහි ලා සහාය වීම පිණිස පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් නියෝජ්‍ය අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය.<br><br>(2) අමාත්‍ය මණ්ඩලයේ කවර හෝ අමාත්‍යවරයකු විසින්, ඔහු වෙත පවරා ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලයක් හෝ කාර්යයක් හෝ යම් කිසි ලිඛිත නීතියකින් ඔහු වෙත පැවරී ඇත්තා වූ හෝ නියම කරනු ලැබ ඇත්තා වූ බලතල කිසිවක් හෝ කාර්යයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් තම නියෝජ්‍ය අමාත්‍යවරයාට පවරා දිය හැකි අතර එකී අමාත්‍යවරයාට එකී බලය හෝ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වී තිබුන ද එකී නියෝජ්‍ය අමාත්‍යවරයා විසින්, එසේ පවරා දෙනු ලැබූ යම් බලයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යනුකූල වන්නේ ය. | **නියෝජ්‍ය අමාත්‍යවරයන්**<br><br>**46 ව්‍යවස්ථාව**<br>(1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ට ඔවුන්ගේ කාර්ය ඉටුකිරීමෙහිලා සහාය වීම පිණිස පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් නියෝජ්‍ය අමාත්‍යවරයන් කලින් කල පත් කරනු ලැබිය හැක්කේ ය.<br><br>(2) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු වෙත පවරා ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් කිසි බලයක් හෝ කාර්යයක් හෝ, යම්කිසි ලිඛිත නීතියකින් පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම්කිසි බලයක් හෝ කාර්යයක් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ඒ අමාත්‍යවරයා විසින් ස්වකීය නියෝජ්‍ය අමාත්‍යවරයාට පවරා දිය හැක්කේ ය. එකී අමාත්‍යවරයාට ඒ බලය හෝ ඒ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, මේ අනුව්‍යවස්ථාව යටතේ එකී නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ යම්කිසි බලයක් හෝ කාර්යයක්, ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යනුකූල වන්නේ ය. | නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කිරීමේ දී ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවතිය ද, යෝජිත 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් එවන් උපදෙස් **පැතීමත් අවශ්‍ය යැයි සලකනු ලබන කල්හි පමණක් අගමැතිවරයාව විමසා සිටිය හැක.** |
| **අග්‍රාමාත්‍යවරයාගේ ධුර කාලය සහ අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව සහ ධුර කාලය සීමා කිරීම**<br><br>**46 ව්‍යවස්ථාව**<br>(1) (අ) අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරයන් සංඛ්‍යාව තිහ නොඉක්මවිය යුතු ය | **අග්‍රාමාත්‍යවරයාගේ, අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ ධුර කාලය.**<br><br>**47 ව්‍යවස්ථාව**<br>අග්‍රාමාත්‍යවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙක් හෝ වෙනත් යම් අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් | **අමාත්‍ය වරුන්ගේ සංඛ්‍යාව පිළිබඳ සීමාවන්**<br><br>වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ගත්කල, අමාත්‍යවරුන් සංඛ්‍යාව සහ කැබිනට් නොවන මෙන්ම නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව සම්බන්ධයෙන් ද සීමාවක් පවතී . ඒ සම්බන්ධයෙන් පවතින ව්‍යාත්රේකය වන්නේ |

| | | |
|---|---|---|
| (ආ) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවේ එකතුව හතලිහ නොඉක්මවිය යුතු ය.<br><br>(2) අග්‍රාමාත්‍යවරයා -<br>(අ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ<br>(ආ) තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවුවහොත් හෝ මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවත්නේ ද ඒ තාක් කල් ස්වකීය ධූරය දරන්නේ ය.<br><br>(3) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙක්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් -<br>(අ) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවනු ලබන ලිපියක් මගින්, ඉවත් කරනු ලැබුවහොත්ත හෝ<br>(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ<br>(ඇ) තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවුවහොත් හෝ මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම්තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවතින්නේ ද ඒ තාක් කල් ස්වකීය ධූරය දරන්නේ ය.<br><br>(4) (1) වන අනු ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුව ද, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවේ දී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් සංඛ්‍යාව ද නියෝජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව ද පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුත්තේ ය.<br><br>(5) (4) වන අනු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා ජාතික ආණ්ඩුවක් යනු, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාව ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සහ පාර්ලිමේන්තුවේ අනෙකුත් පිළිගත් | (අ) ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවන ලිපියක් මගින් ඉවත් කරනු ලැබුවහොත්<br><br>(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් අස්වුවහොත් හෝ<br><br>(ඇ) තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවුවහොත් මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම්තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවත්නේ ද ඒ තාක් කල් ස්වකීය ධූරය දරන්නේ ය. | ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවක දී වන අතර, එවන් තත්ත්වයක දී අමාත්‍යවරුන්ගෙන්, කැබිනට් නොවන අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව තීරණය කරනු ලැබීම පාර්ලිමේන්තුව විසින් කළ යුතුය.<br><br>කෙසේ වුවද, යෝජිත 20 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි **එවන් සීමාවක් ඇතුලත් නොවේ**.<br><br>**අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීම**<br><br>වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට නොමැති අතර අග්‍රාමාත්‍යවරයා ඉල්ලා අස් වන්නේ නම් හෝ පාර්ලිමේන්තුවේ සාමාජිකයෙකු වීම නතර කරනු ලබන්නේ **නම් හැර මිස**, කැබිනට් මණ්ඩලය ක්‍රියාත්මකව පවතින තාක් දුරට අග්‍රාමාත්‍ය තනතුර දැරීමේ හැකියාව පවතී.<br><br>20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ තත්වය සලකා බලන විට, අමාත්‍යවරයකු ඉවත් කිරීම සඳහා පවතින ප්‍රතිපාදන ඔස්සේම අගමැතිවරයා ඉවත් කිරීමේ ක්‍රියාවලිය ද සිදු වන අතර එසේ ඉවත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට ඇත.<br><br>**අමාත්‍යවරයකු, කැබිනට් නොවන අමාත්‍යවරයකු සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් ඉවත් කිරීම**<br><br>වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, එකී කවර වර්ගයක අමාත්‍ය තනතුරු දරන්නන් වුවද, **අගමැතිවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලබන්නේ නම්** හෝ ඔවුන්ගේ පාර්ලිමේන්තු සාමාජිකත්වයන් නතර කිරීම හෝ ඉල්ලා |

| | | |
|---|---|---|
| දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එකතුව පිහිටුවනු ලබන ආණ්ඩුවක් වන්නේ ය. | | අස්වීම සිදුකරන්නේ නොමැතිනම් ඔවුන් තවදුරටත් ක්‍රියාකාරී වේ.<br><br>යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අග්‍රාමාත්‍යවරයා ද ඇතුළුව අමාත්‍යවරයෙකු ඉවත්කිරීමේ ඒකමතික හැකියාවක් ජනාධිපතිවරයා සතු වේ.<br><br>(කෙසේ නමුත් මෙය යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 43 (3) ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත් වන අතර ඒ අනුව පාර්ලිමේන්තුවේ යම්කිසි මන්ත්‍රීවරයකු කෙරෙහි පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම පමණින් ඇතැයි ජනාධිපතිවරයා කල්පනා කෙරේද ජනාධිපතිවරයා විසින් ඒ මන්ත්‍රීවරයා අග්‍රාමාත්‍ය ධුරයට පත් කළ යුත්තේ ය.) |
| **පාර්ලිමේන්තුව විසුරුවා ඇති කාලය තුළ අමාත්‍ය මණ්ඩලය.**<br><br>**47 ව්‍යවස්ථාව**<br><br>(1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන තෙක් ක්‍රියාකළ අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, දිගටම ක්‍රියා කළ යුතු අතර මහමැතිවරණය අවසාන වූ විට, එසේ ක්‍රියා කිරීම නතර කළ යුත්තේ ය. ඒ අනුව අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෝ ද 46 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සහ (3) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධාන සලසා ඇති පරිදි ධූර දැරීම නතර වුවහොත් මිස, දිගටම ක්‍රියා කළයුතු අතර එසේ ධූර දැරීමේ දී ඔවුන් විසින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන නිර්නායකයන් පිළිපදිමින් මැතිවරණයට අයුතු ලෙස බලපෑමක් නොවන පරිද්දෙන් ක්‍රියා කළ යුත්තේ ය. | **පාර්ලිමේන්තුව විසුරුවා ඇති කාලය තුළ අමාත්‍ය මණ්ඩලය.**<br><br>**48 ව්‍යවස්ථාව**<br>(1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන තෙක් ක්‍රියා කළ අමාත්‍ය මණ්ඩලය, පාර්ලිමේන්තුව ඇති කාලය තුළ විසුරුවා හරිනු ලැබුව ද දිගටම ක්‍රියා කළ යුතු අතර, මහ මැතිවරණය අවසාන වූ විට එසේ ක්‍රියා කිරීම නතර කළ යුත්තේ ය. ඒ අනුව, අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද වෙනත් අමාත්‍යවරයන් ද නියෝජ්‍ය අමාත්‍යවරයන් ද, 47 වන ව්‍යවස්ථාවේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි ධූර දැරීම නතර වුවහොත් මිස, දිගටම ක්‍රියා කරන්නාහ.<br><br>(2) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා මිය ගියේ වුව ද, ධූරයෙන් ඉවත් කරනු ලැබූයේ වුව ද, අස්වූයේ වුව ද, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කරන්නේ ය. තව ද, අග්‍රාමාත්‍යවරයාගේ | වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශිතවම පෙන්වා දී ඇති ප්‍රතිපාදන අනුව පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී නැවත පාර්ලිමේන්තු මහා මැතිවරණයක් පැවැත්වෙන තාක් කල් කැබිනට් මණ්ඩලය ක්‍රියාත්මකව පවතින අතර මැතිවරණ කොමසාරිස් කොමසාරිස්වරයා විසින් පෙන්වාදෙන්නට **නිර්ණායකයන් යටතේ ක්‍රියා කළ යුතු** අතර මැතිවරණය සම්බන්ධයෙන් කිසිදු ආකාරයක අයතා බලපෑමක් සිදු නොකළ යුතුය. මෙකී ප්‍රකාශක විධිවිධානය යෝජිත 20 වන ආණ්ඩුකුම ව්‍යවස්ථා සංශෝධනය මඟින් **ඉවත් කර තිබේ.**<br><br>පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ සිට පාර්ලිමේන්තු මහ මැතිවරණයක් පවත්වා අවසන් කරන තෙක් කාලය අතරතුර යම් හෙයකින් අග්‍රාමාත්‍යවරයා මරණයට පත්වුවහොත්, එකී තනතුරෙන් ඉවත් කරනු |

| | | |
|---|---|---|
| (2) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහමැතිවරණය අවසානවීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා මිය ගියේ වුව ද, ධූරයෙන් ඉවත් කරනු ලැබුවේ වුව ද, අස්වූයේ වුව ද, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තව ද අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත්කරනු ලැබිය හැක්කේ ය.<br><br>(3) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසානවීමත් අතර කාලය තුළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු මිය ගිය විට හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ඉල්ලා අස්වූ විට ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීම හෝ ඒ අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට වෙනත් කවර වූ හෝ අමාත්‍යවරයකු ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත පත්කරනු ලැබිය හැක්කේ ය. | බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත් කරනු ලැබිය හැක්කේ ය. නැතහොත් ඒ බලතල, කාර්ය හා කර්තව්‍ය ජනාධිපතිවරයා විසින් ම ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයෙක් නොසිටී නම් මහ මැතිවරණය අවසාන වන තෙක්, අමාත්‍ය මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ජනාධිපතිවරයා විසින් ම ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුත්තේ ය.<br><br>(3) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු හෝ වෙනත් යම් අමාත්‍යවරයකු හෝ මිය ගිය විට, ධූරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ඉල්ලා අස් වූ විට ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීමට හෝ ඒ අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට වෙනත් කවර වූ හෝ අමාත්‍යවරයකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය. නැතහොත් ජනාධිපතිවරයා විසින් ම ඒ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීම හෝ ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය තමා විසින් ම ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැක්කේ ය. | ලැබුවහොත් හෝ  ඉල්ලා අස් වුවහොත් අග්‍රාමාත්‍යවරයාගේ කා්රය කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කිරීමේ  බලය වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාගේ වෙත ලබා දී තිබේ (47 (2) ව්‍යවස්ථාව). කෙසේ නමුත්, යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ගත් කල, එවන් වෙනත් අමාත්‍යවරයෙකු නොමැති කල්හි, අග්‍රාමාත්‍යවරයාගේ කාර්ය කර්තව්‍යයන් ඉටුකිරීම ජනාධිපතිවරයා විසින් කළ යුතු බව සඳහන් වේ.<br><br>එමෙන්ම, අමාත්‍යවරයකු සම්බන්ධයෙන් ඉහත කී තත්ත්වය සලකා බලන කල්හි, එනම් අමාත්‍යවරයක මරණයට පත්වීම, තනතුරෙන් ඉවත් කිරීම හෝ ඉල්ලා අස්වීම වැනි තත්ත්වයකදී  එකී බලතල ක්‍රියාවට යෙදීමේ හැකියාව ජනාධිපතිවරයා වෙත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ලබාදී තිබේ. |
| **වැඩබලන අමාත්‍යවරයන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්.**<br><br>**49 ව්‍යවස්ථාව**<br><br>අමාත්‍ය මණ්ඩලයේ යම් කිසි අමාත්‍යවරයකුට හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජියකු නොවන අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ ඔහුගේ ධූරයේ කාර්ය ඉටුකිරීමට නොහැකි වුවහොත් එවිට එකී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ධූරයේ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත පාර්ලිමේන්තුවේ කවර වූ හෝ මන්ත්‍රීවරයකු පත් කිරීම කළ හැකි වන්නේ ය. | **වැඩබලන අමාත්‍යවරයන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්.**<br><br>**50 ව්‍යවස්ථාව**<br><br>අමාත්‍ය මණ්ඩලයේ යම් කිසි අමාත්‍යවරයකුට හෝ වෙනත් අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ සිය ධූරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වුවහොත්, එවිට එකී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ වෙනත් අමාත්‍යවරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ හෝ ධූරයේ වැඩ බැලීමට පාර්ලිමේන්තුවේ කවර වූ හෝ මන්ත්‍රීවරයකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය. | වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව වැඩබලන අමාත්‍යවරයකු පත් කිරීමේ දී ජනාධිපතිවරයා විසින් අගමැතිවරයාගේ උපදෙස් මත ක්‍රියා කළ යුතු වුවද යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ එකී අවශ්‍යතාවය අත්හැර දමා තිබේ. |

| | | |
|---|---|---|
| **අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා.**<br><br>51 ව්‍යවස්ථාව<br>(1) අග්‍රාමාත්‍යවරයාට, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.<br>(2) අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් අග්‍රාමාත්‍යවරයාගේ විධානයන්ට යටත්ව ඔහුගේ ධූරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම හා කිරීමත් ලේකම්වරයා විසින් කළ යුත්තේ ය.<br><br>**අමාත්‍යාංශයන්හි ලේකම්වරයන්.**<br><br>52 ව්‍යවස්ථාව<br><br>(1) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ සෑම අමාත්‍යංශයක්ම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.<br><br>(2) අමාත්‍යංශයක ලේකම්වරයා ඔහුගේ අමාත්‍යවරයා භාරයේ ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ද වෙනත් ආයතන ද අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්ව මෙහෙය වන්නේ ය.<br><br>(3) අමාත්‍යංශයක ලේකම්වරයා ධූරය දැරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිර ගිය විට හෝ ඒ අමාත්‍යංශයේ පැවැත්ම නතරවීමේ ප්‍රතිඵලය ඇති තීරණයක් 43 වන ව්‍යවස්ථාව හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලැබූ විටක හෝ නතර විය යුත්තේ ය.<br><br>(4) මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ ධූරය, අමාත්‍ය මණ්ඩලයේ ල්කම්වරයාගේ ධූරය, විගණකාධිපතිවරයාගේ ධූරය, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) ධූරය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ ධූරය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ලෙස නොසැලකිය යුත්තේ ය. | **අමාත්‍යාංශයන්හි ලේකම්වරයන්.**<br><br>52 ව්‍යවස්ථාව<br>(1) එක් එක් අමාත්‍යාංශයට ලේකම්වරයෙක් වන්නේ ය. ජනාධිපතිවරයා විසින් ඒ ලේකම්වරයා පත් කරනු ලබන්නේ ය.<br><br>(2) අමාත්‍යාංශයේ ලේකම්වරයා ස්වකීය අමාත්‍යවරයා භාරයේ ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ද වෙනත් ආයතන ද, ස්වකීය අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්ව, මෙහෙයවන්නේ ය.<br><br>(3) යම් අමාත්‍යාංශයක ලේකම්වරයා ධූරය දැරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිර ගිය විට හෝ ඒ අමාත්‍යාංශයේ පැවැත්ම නතර වීමේ ප්‍රතිඵලය ඇති තීරණයක් 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලැබූ විටක හෝ නතර විය යුත්තේ ය.<br><br>(4) අමාත්‍යාංශයක ලේකම්වරයා ධූරය දැරීම එසේ නතර වූ අවස්ථාවක අමාත්‍ය මණ්ඩලය විසින් ඒ ලේකම්වරයා රජයේ සේවයේ වෙනත් යම්කිසි තනතුරකට පත් කරනු ලැබිය හැක්කේ ය.<br><br>එසේ වුව ද, ලේකම් ධූරයට පත් කරනු ලබන තෙක් රජයේ සේවයෙහි හෝ පළාත් පාලන සේවයෙහි හෝ යම්කිසි රාජ්‍ය සංස්ථාවක සේවයෙහි යෙදී සිටි තැනැත්තකු ඒ සේවයෙන් තාවකාලිකව මුදා හරිනු ලැබුවාක් සේ සැලකිය යුතු අතර, ලේකම්වරයකු වශයෙන් ධූරය දැරීම නතර වූ විට ඒ තැනැත්තාට ජ්‍යෙෂ්ඨතාවය අහිමිවීමක් නොමැතිව එකී සේවයට ආපසු පැමිණීමට හිමිකම තිබිය යුත්තේ ය.<br><br>(5) මේ ව්‍යස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානය, අමාත්‍යාංශයක ලේකම්වරයකුට පහත සඳහන් අවස්ථාවලදී, එනම්-<br><br>(අ) විනය හේතු මත සේවයෙන් පහ කිරීම නොවන වෙනත් ආකාරයකින් ජනාධිපතිවරයා විසින් ඒ ලේකම්වරයාගේ සේවය අවසාන කළ විටක හෝ | යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ අග්‍රාමාත්‍යවරයාගේ ලේකම් තනතුර සඳහා වෙනම විධිවිධානයක් ඇති කර නොමැත.<br><br>යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි 52 (4) ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවයෙහි වෙනත් කිසිදු තනතුරක් දැරීම නතර කරන ලද තැනැත්තෙකු ලේකම්වරයෙකු වශයෙන් පත් කිරීමේ හැකියාව කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන්ට ලබාදී තිබේ.<br><br>රජයේ සේවයෙහි හෝ පළාත් පාලන සේවයෙහි හෝ යම්කිසි රාජ්‍ය සංස්ථාවක සේවයෙහි යෙදී ලේකම් වරයෙක් ඒ සේවයෙන් තාවකාලිකව මුදා හරිනු ලැබුවාක් සේ සලකන අතර, ලේකම්වරයකු වශයෙන් ධූරය දැරීම නතර වූ විට ඒ තැනැත්තාට ජ්‍යෙෂ්ඨතාවය අහිමිවීමක් නොමැතිව එකී සේවයට ආපසු පැමිණීමට හිමිකම තිබේ.<br><br>රජයේ නිලයන් වශයෙන් සලකනු නොලබන තැනැත්තන්ගේ තනතුරු ලැයිස්තුව යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ සංශෝධනය කර ඇත. |

| | | |
|---|---|---|
| | (ආ) ඒ ලේකම්වරයා ඉල්ලා අස්වන දිනයේ දී ඔහුට විරුද්ධව විනය පිළිබඳ කටයුත්තක් විභාගයට භාජනව ඇත්නම් හෝ එය විභාගයට ගැනීමට අදහස් කර ඇත්නම් මිස, ඔහු ඉල්ලා අස් වූ විට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.<br><br>(6) ජනාධිපතිවරයාගේ ලේකම් ධුරය හෝ යම්කිසි අමාත්‍යාංශයක ලේකම් ධුරය හෝ ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ යම් කිසි ධුරයක් හෝ ඒ ධුර එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නොකඩවා දරා ඇති කවර වූ හෝ තැනැත්තකු අවසන් වරට දැරූ ධුරය ඔහු විසින් නොකඩවා දැරූ සේ මේ ව්‍යවස්ථාවේ (4) වන සහ (5) වන අනුව්‍යවස්ථාවල කාර්ය සඳහා සැලකිය යුත්තේ ය. | |

## පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් පවතින වෙනස්කම්

| | | |
|---|---|---|
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 (1) වන ව්‍යවස්ථාව**<br><br>ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයක් මගින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම කළ හැක්කේ යඃ<br><br>එසේ වුවද, පාර්ලිමේන්තුව විසින් එහි නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුලුව මුළු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් මිස, පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කරගනු ලැබූ දිනයෙන් අවුරුදු හතරක් සහ මාස හයක කාලයක් අවසන් වන තෙක් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නොකල යුත්තේ ය. | **20 වන සංශෝධනයෙහි 14 වගන්තිය මගින් 70 (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කෙරේ.**<br><br>(1) ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශනයක් මගින් පාර්ලිමේන්තුව කැඳවීම, පාර්ලිමේන්තුවේ වාරාවසාන කිරීම සහ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම කළ හැක්කේ ය.<br>එසේ වුව ද -<br>(අ) (ඈ) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මහ මැතිවරණයක් පවත්වනු ලැබ ඇති විට ඉන් ඉක්බිතිව පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස යෝජනා සම්මතයෙන් පාර්ලිමේන්තුව ඉල්ලා සිටියහොත් මිස, ඒ මහ මැතිවරණය පැවැත්වූ දින සිට එක් අවුරුද්දක කාලසීමාවක් ඉකුත් වන තෙක් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා නොහැරිය යුත්තේ ය.<br><br>(ආ) මහ මැතිවරණයකින් ඉක්බිතිව පැවැත්වෙන පාර්ලිමේන්තුවේ පළමුවන වාරය ආරම්භයේ දී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රතික්ෂේප කරනු ලැබූ විටක දී ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා නොහැරිය යුත්තේ ය. | සීමිත ව්‍යතිරේකී අවස්ථාවන්හිදී හැර, මහ මැතිවරණයකින් පසුව වසරක කාලක් ඉක්ම ගිය පසුව ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයාට ලබා දීම යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් සිදුව තිබේ.<br><br>මේ ඔස්සේ ජනාධිපති ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් ඇති බලය / පාලනය (ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ ඕනෑම සමාජිකයෙකු අමාත්‍යවරයකු වශයෙන් පත් කිරීමට ඇති හැකියාව මෙන්ම අමාත්‍යවරුන් ඕනෑම සංඛ්‍යාවක් පත් කිරීමේ හැකියාවද එක්ව ගත් කල) වඩා පුළුල් වී ඇත.<br><br>පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විසින් සම්මත කරගනු ලබන යෝජනාවක් හරහා ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරීම |

| | | |
|---|---|---|
| | (ඇ) (ඈ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, 38 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (අ) හා (ආ) ඡේදවල නියමයන්ට අනුකූල වන යෝජනා සම්මතයක් කථානායකවරයා විසින් භාර ගැනීමෙන් පසුව -(i) ඒ යෝජනා සම්මතය 38 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයෙහි නියමිත පරිදි සම්මත නොවුවහොත් මිස;<br><br>(ii) ස්වකීය ධුරයට අයත් කාර්ය ඉටු කිරීමට නියත වශයෙන් ම නොහැකි තත්ත්වයකට ජනාධිපතිවරයා පත්ව නැතැයි හෝ ඒ යෝජනා සම්මතයේ ඇතුළත් වෙනත් කිසිම චෝදනාවකටවත් ජනාධිපතිවරයා වරදකරු වී නැතැයි හෝ ශ්‍රේෂ්ඨාධිකරණය නිශ්චයකර වාර්තා කළහොත් මිස; (iii) ජනාධිපතිවරයා ඉවත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද එකී යෝජනා සම්මතය 38 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ නියමිත පරිදි සම්මත නොවුවහොත් මිසත හෝ (iv) පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියහොත් මිස, ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා නොහැරිය යුත්තේ ය.<br><br>(ඈ) පාර්ලිමේන්තුව විසින් විසර්ජන පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු නොලැබූ අවස්ථාවක ඊළඟ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුත්තේ ය.". | සඳහා ඉල්ලීමක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැක. මෙවන් යෝජනාවක් සඳහා අවශ්‍ය වන්නේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මන්ත්‍රීවරුන්ගේ සරල බහුතරයකි. |
| ***ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1) (ඈ) (xiii) වන ව්‍යවස්ථාව***<br><br>92 (ආ) ව්‍යවස්ථාව පරිදි ද්විත්ව පුරවැසිභාවය ඇති තැනැත්තන්ට ඒකී විධිවිධානය ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වීමේ හැකියාව නොමැත. එලෙස ද්විත්ව පුරවැසිභාවය ඇති තැනැත්තෙකුට ජනරජයේ ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්වීමේ හැකියාව නොමැත. | **20 වන සංශෝධනයේ 17 වන වගන්තිය මගින් 91 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) (Xiii) ඡේදය ඉවත් කර තිබීම** | පාර්ලිමේන්තු මැති මැතිවරණයන් හෝ ජනාධිපතිවරණ සඳහා තරග කිරීමේ දී ද්විත්ව පුරවැසිභාවය තවදුරටත් නුසුදුසුකමක් නොවේ. |

<table>
<tr><th colspan="3">නීති සම්පාදන ක්‍රියාවලියට ඇති බලපෑම</th></tr>
<tr>
<td>78 (1) ව්‍යවස්ථාව<br>සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් දහහතරකට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය.</td>
<td>20 වන සංශෝධනයෙහි 15 (1) වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (1) ව්‍යවස්ථාව ඉවත් කර පහත අනුව්‍යවස්ථාව ආදේශ කර තිබීම:<br><br>සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් හතකට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය.</td>
<td rowspan="3">යම් පනත් කෙටුම්පත්ක් පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම්ට පෙර එය මහජනතාවට ලබා ගැනීම සඳහා ඇති ඉඩ ප්‍රස්ථාව (ගැසට් පත්‍රයේ පළ කිරීම් හරහා) ලබා දී ඇති කාල පරාසය මෙකී යෝජිත සංශෝධනය මගින් සීමා කර තිබේ (දින 14 සිට දින 7 ක් දක්වා).<br><br>පනත් කෙටුම්පත් සඳහා කම්ටු මට්ටමින් අසාමාන්‍ය පුළුල් සංශෝධනයන් ඉදිරිපත් කිරීමට අදාල සීමාවන් මෙකී යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ඇති කිරීමට උත්සාහ දරනු ලබන බව පෙන්නුම් කෙරේ. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිරන්තරයෙන්ම මේ ආකාරයෙන් වූ කම්ටු මට්ටමේ සංශෝධනයන් සම්බන්ධයෙන් <u>ස්වකීය විවේචනයන් ඉදිරිපත් කර තිබේ</u>)<br><br>කෙසේ නමුත්, පාර්ලිමේන්තුව තුළ සිදුවන කම්ටු මට්ටමේ කිසිදු ආකාරයක සංශෝධන <u>අධිකරණමය සමාලෝචනයක්</u> සඳහා යොමු කිරීමේ ඉඩ ප්‍රස්ථාවක් නොමැති හෙයින් මෙලෙස පවතින ආරක්ෂණය බලාත්මක කිරිම සඳහා යාන්ත්‍රණයක් ද නොපවතී.<br><br>''ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය වන්නා වූ'' යන සහතික කිරීම සහිතව කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන් හරහා ලැබෙන්නා වූ ඕනෑම පනත් කෙටුම්පතක් සෘජුවම ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමේ හැකියාව මෙම සංශෝධනය මගින් ලබා දේ. <u>ජනාධිපති වරයාගේ උපදෙස් පරිදි</u> එවන් වූ හදිසි පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව</td>
</tr>
<tr>
<td></td>
<td>20 වන සංශෝධනයෙහි 15 (2) වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (3) නව ව්‍යවස්ථාව ඇතුලත් කර තිබීම:<br><br>"පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුව තුළ දී යෝජනා කරනු ලබන යම් සංශෝධනයක් ඒ පනත් කෙටුම්පතේ හරයට සහ මූලධර්මවලට පරිබාහිර සංශෝධනයක් නොවිය යුත්තේ ය.".</td>
</tr>
<tr>
<td>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආණ්ඩුවට ''හදිසි පනත් කෙටුම්පත්'' කිරීමට අවසර දී නොමැත</td>
<td>20 වන සංශෝධනයෙහි 27 වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 122 නව ව්‍යවස්ථාව ඇතුලත් කර තිබීම:<br><br>(1) අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය වන්නා වූ ද ඒ බවට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ අත්සන ඇති සටහනක් දරන්නා වූ ද පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන්-<br><br>(අ) මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, 78 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන සහ 121 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවන්නේ ය ;<br><br>(ආ) ඒ පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තීරණය අග්‍ර විනිශ්චයකාරවරයා අමතා යවන ලිඛිත යොමු කිරීමක් මගින් ජනාධිපතිවරයා විසින් ඉල්ලා සිටිය යුත්තේ ය. ඒ යොමු කිරීමේ පිටපතක් ඒ අවස්ථාවේ දී ම කථානායකවරයා වෙත භාර දිය යුත්තේ ය;</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| | (ඇ) ශ්‍රේෂ්ඨාධිකරණය කැඳවනු ලැබ **<u>පැය විසිහතරක් ඇතුළත (හෝ ජනාධිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දවස් තුනක් නොඉක්මවන ඊට වැඩි කාලයක් ඇතුළත) ඒ අධිකරණය විසින් ස්වකීය තීරණයට එළඹිය යුත්තේ ය.</u>** ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම තීරණය ජනාධිපතිවරයාට සහ කථානායකවරයාට පමණක් දැනුම් දිය යුත්තේ ය.<br><br>(2) 121 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ පනත් කෙටුම්පතට අදාළ වන්නේ ය.<br><br>(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් විධිවිධානයක් සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම සහ ප්‍රතියෝජනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම පිණිස වූ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම සහ ප්‍රතියෝජනය කිරීම පිණිස වූ යම් පනත් කෙටුම්පතකට මේ ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවිය යුත්තේ ය.". | ව්‍යවස්ථානුකූල තත්ත්වය පිළිබඳ තීරණය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට පැය 24 ක හෝ 72 ක කාල පරාසයක් ලබාදෙනු ඇත.<br><br>''හදිසි පනත් කෙටුම්පත්''' ගැසට් කිරීමේ අවශ්‍යතාවයක් නොපවතී. මේ තුළින් පාර්ලිමේන්තු හරහා සම්මත කිරීමට යෙදෙන එවන් වූ පනත් කෙටුම්පත් වල අන්තර්ගතය පවා කවරක් ද යන්න පිළිබඳ පිළිබඳව පුරවැසියන්ට දැනගැනීමට නොහැකි වීමේ තත්ත්වයක් උද්ගත කරයි.<br><br>එවන් වූ ක්‍රියාවලියක් තුළ පුරවැසියන් හට **සවන්දීම සඳහා ඇති අයිතිවාසිකම අහිමි වන්නා සේම** කිසියම් පුද්ගලයකුට සවන් දීමට ඉඩප්‍රස්ථාව ලබා දෙන්නේ ද නැද්ද යන්න පිළිබඳ අවශ්‍යතාවයක් ඇත්තේ යැයි අධිකරණයට හැඟී යන පරිදි තීරණය කිරීමේ හැකියාව ශ්‍රේෂ්ඨාධිකරණයට පවතී (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 ව්‍යවස්ථාව).<br><br>කෙසේ නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන හෝ නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් හදිසි පනත් කෙටුම්පතක ස්වභාවයෙන් සම්මත කිරීමේ හැකියාවක් නොමැත. එසේ වුවද, කාලය සම්බන්ධයක් පවතින සීමාව මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල භාවයට පටහැනි පනත් කෙටුම්පත් නීති බවට සම්මත කිරීමේ හැකියාවක් ඒ තුළ පවතී (80 (3) ව්‍යවස්ථාව). |
| පාර්ලිමේන්තුව මගින් ප්‍රතික්ෂේප කරන ලද කිසිදු පනත් කෙටුම්පතක් (**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** සංශෝධනයක් නොවන) ජනමත විචාරණයක් හරහා ඉදිරිපත් කිරීමේ අවසරයක් **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** මගින් ජනාධිපතිවරයාට ලබා දී නොමැත | **20 වන සංශෝධනයෙහි 16 වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 85 (2) නව ව්‍යවස්ථාව ඇතුලත් කර තිබීම:**<br><br>පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම හෝ සඳහා වූ පනත් කෙටුම්පතක් නොවන නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යම් විධිවිධානයක් එකතු කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් | නීති සම්මත කිරීමේදී පාර්ලිමේන්තුවේ මඟ හැර යැමේ හැකියාව මෙමඟින් ජනාධිපතිවරයාට ලබා දී තිබේ. කෙසේ නමුත් අවසාන තීන්දුව ජනතාව සතුය. |

<table>
<tr><td></td><td>නොවන එසේත් නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් නොවන හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් කිසි විධිවිධානයකට අනනුකූල පනත් කෙටුම්පතක් නොවන) පනත් කෙටුම්පතක් ජනාධිපතිවරයා විසින් ස්වකීය අභිමතය පරිදි ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.</td><td></td></tr>
<tr><td colspan="3">මැතිවරණ කොමිෂන් සභාවේ බලතල සම්බන්ධයෙන් වන බලපෑම</td></tr>
<tr><td>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 ව්‍යවස්ථාව<br><br>මැතිවරණ කොමිෂන් සභාව<br><br>103 (1) (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. කොමිෂන් සභාව, යම් වෘත්තීන් හි හෝ පරිපාලන හෝ අධ්‍යාපන ක්ෂේත්‍රවල හෝ, විශිෂ්ටතා හිමිකරගෙන සිටින තැනැත්තන් අතුරෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය. පත් කරනු ලබන එක් සාමාජිකයකු නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වරයකු වශයෙන් හෝ ඊට ඉහළ වූ හෝ ධූරයක් උසුලනු ලැබූ මැතිවරණ දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයකු විය යුත්තේ ය. <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත</u> ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.<br><br>103 (7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට කොමිෂන් සභාවට අදාළ ඔහුගේ රාජකාරි කටයුතුවලින් මාස දෙකක් නොඉක්මවන කාලයක් සඳහා තාවකාලිකව නිවාඩු දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු ඒ නිවාඩු කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැක්කේ ය. <u>ඒ</u></td><td>20 වන සංශෝධනයෙහි 19 වන වගන්තිය මගින් 103 (1) සහ 103 (7) ව්‍යවස්ථාව සංශෝධනය කිරීම<br><br>103 (1) (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. කොමිෂන් සභාව, යම් වෘත්තීන්හි හෝ පරිපාලන හෝ අධ්‍යාපන ක්ෂේත්‍රවල විශිෂ්ටතා හිමිකරගෙන සිටින තැනැත්තන් අතුරෙන් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය. ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.<br><br>103 (7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට කොමිෂන් සභාවට අදාළ ඔහුගේ රාජකාරි කටයුතුවලින් මාස දෙකක් නොඉක්මවන කාලයක් සඳහා රාජකාරි නිවාඩු දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු ඒ නිවාඩු කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැක්කේ ය.</td><td>මැතිවරණ කොමිෂන් සභාව සඳහා පත් කිරීම් සිදු කිරීමේ දී සඳහන් අවශ්‍යතාවයන් තවදුරටත් අවශ්‍ය නොවේ:<br><br>➢ මැතිවරණ කොමිෂන් සභාව සඳහා පත්වීම් කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය.<br>➢ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම.<br>➢ මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයෙකු මැතිවරණ දෙපාර්තමේන්තුව තුළ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වරයෙකු හෝ ඊට ඉහළ තනතුරක් දැරූ තැනැත්තෙකු වීමේ අවශ්‍යතාව.<br><br>ජනාධිපතිවරයා විසින් මැතිවරණ කොමිෂන් සභාව සඳහා තාවකාලිකව සිදු කරනු ලබන පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය තවදුරටත් අවශ්‍යතාවයක් නොවේ.</td></tr>
</table>

| | | |
|---|---|---|
| ***<u>සෑම පත් කිරීමක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත විය යුත්තේ ය.</u>***<br><br>**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (4) ව්‍යවස්ථාව** මගින් රජයට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් දේපළ මැතිවරණ ප්‍රචාරණය සඳහා භාවිත කිරීම තහනම් කිරීමේ විධිවිධාන මැතිවරණ කොමිෂන් සභාවට සලසා දී තිබේ.<br><br>**104ආ (4) (අ)** මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් - (i) ඒ **<u>ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක්</u>** හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත් කර ගැනීම, ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්ය සඳහා භාවිත කිරීම තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය. | **20 වන සංශෝධනයෙහි 20 (1) වන වගන්තිය මගින් 104ආ (4) (අ) (i)** වන ඡේදයේ "තරඟ කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ" යන වචන වෙනුවට " තරඟ කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ" යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කර ඇත | මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය සහ පත්කිරීම් සම්බන්ධයෙන් සිදුව ඇති වෙනස්කම් සලකා බලන විට, එය 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි පැවැති තත්ත්වයම බව පැහැදිලි වේ. |
| | **20 වන සංශෝධනයෙහි 20 (2) වන වගන්තිය මගින් 104ආ (4) (අ) (i) අනු ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත විධිවිධානය ඇතුළත් කර ඇත:**<br><br>(4අ) කොමිෂන් සභාව විසින්, අවස්ථාවෝචිත පරිදි, මැතිවරණයක් පැවැත්වීම සඳහා නියමයක් කරනු ලබන දිනය සමඟ හෝ ජනමත විචාරණයක් පැවැත්වීම නියම කරමින් ප්‍රකාශනයක් කරනු ලබන දිනය සමඟ හෝ ආරම්භ වන කාල පරිච්ඡේදය තුළ නිකුත් කරනු ලබන යම් උපමාන-<br><br>(අ) අවස්ථාවෝචිත පරිදි, අදාළ මැතිවරණය පැවැත්වීම සමඟ හෝ අදාළ ජනමත විචාරණය පැවැත්වීම සමඟ හෝ ඍජුව සම්බන්ධ වූ කාරණාවලට පමණක් සීමා විය යුතු බව; සහ<br><br>(ආ) රාජ්‍ය සේවයට අදාළ යම් කාරණයකට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ යම් කාරණයකට හෝ ඍජුව සම්බන්ධ නොවිය යුතු බව, සැක දුරුකිරීම සඳහා මෙයින් සඳහන් කරනු ලැබේ." | මෙම නව හඳුන්වාදීම් ඔස්සේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන මෙකී උපමානයන් ඍජුවම යම් මැතිවරණ හෝ ජනමත විචාරණ පැවැත් වීමක් සඳහා අදාල විෂය කාරණා වලට පමණක් සීමා වන තත්වයක් ඇත. ඒ අනුව රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සේවාව කොමිෂන් සභාවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන විෂය කාරණාවන්ට අදාල වෙනත් කිසිදු විෂය කරුණක් සම්බන්ධයෙන් උපමාන නිකුත් කිරීම සඳහා අධිකාරී බලයක් මැතිවරණ කොමසාරිස්වරයාට හිමි නොවේ.<br><br>සියලුම ගුවන්විදුලි සේවාවන් හෝ රූපවාහිනී සේවාවන් පවත්වාගෙන යන්නන් හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු නැතහොත් ප්‍රකාශකයකු හෝ විසින් මැතිවරණ කොමසාරිස්වරයා යම්කිසි මැතිවරණ හෝ |

| | | |
|---|---|---|
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (ආ)** මගින් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන අනුව රජයේ මාධ්‍ය ක්‍රියා කිරීම සහතික කර තිබේ.<br><br>**104ආ (5) (ආ)** (අ) ඡේදය යටතේ, අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා වෙත, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා වෙත, ස්වාධීන රූපවාහිනී නාලිකාවේ සභාපතිවරයා වෙත සහ වෙනත් සියලු රජයට අයත් හෝ රජයේ පාලනයට යටත් ගුවන් විදුලි හෝ රූපවාහිනී ව්‍යවසායක ප්‍රධාන විධායක නිලධරයා වෙත නිකුත් කරනු ලැබූ උපමාන අනුව ක්‍රියා කිරීම සහතික කෙරෙන සියලු පියවර ගැනීම, ඔවුන්ගේ කාර්යය විය යුත්තේ ය. | **20 වන සංශෝධනයෙහි 20 (3) වන වගන්තිය මගින් 104ආ (5) (ආ) අනු ව්‍යවස්ථාව ඉවත් කර පහත ව්‍යවස්ථාව ආදේශ කර ඇත:**<br><br>104ආ (5) (ආ) ***<u>යම් ගුවන්විදුලි සේවයක් හෝ රූපවාහිනී සේවයක් පවත්වාගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු නැතහොත් ප්‍රකාශකයකු</u>*** හෝ විසින් (අ) ඡේදය යටතේ ඔවුන් වෙත නිකුත් කරනු ලැබූ යම් උපමාන පිළිපැදීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවරගැනීම, අවස්ථාවෝචිත පරිදි, එකී ගුවන්විදුලි සේවය හෝ රූපවාහිනී සේවය පවත්වාගෙන යන්නාගේ හෝ ප්‍රවෘත්ති පත්‍රයේ අයිතිකරුගේ නැතහොත් ප්‍රකාශකයාගේ හෝ කාර්යය වන්නේ ය. | ජනමත විචාරණ පැවැත්වීම නිදහස් හා සාධාරණව සිදු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන කල්හි කලින් කලට නිකුත් කරනු ලැබූ යම් උපමාන පිළිපැදීම සහතික කල යුතු වේ.මීට පෙර මෙම විධිවිධානය අදාල වුයේ සියලු රජයට අයත් හෝ රජයේ පාලනයට යටත් ආයතනයන්ට පමණි.<br><br>මේ වූ කලී 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පැවැති තත්ත්වයම නැවත ප්‍රවේශ වීමකි. |
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ (1) ව්‍යවස්ථාව**<br>මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා<br><br>**104ඉ (1)** මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙක් සිටිය යුත්තේ ය. ඒ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ***<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව</u>*** කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ නියමයන් සහ කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.<br><br>**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උළ ව්‍යවස්ථාව** මගින් මැතිවරණ කොමිෂන් සභාවේ විධාන වලට අනුකූල වීමට අපොහොසත් වීම වරදක් වියයුතු බව<br><br>**104 උළ** (1) කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව -<br><br>(අ) යම් ඡන්ද විමසීමක් පැවැත්වීමට හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ යම් නීතියක් බලාත්මක කිරීම සහතික කිරීම පිණිස කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ප්‍රතික්ෂේප කරන හෝ අපොහොසත්වන හෝ | **20 වන සංශෝධනයෙහි 21 වන වගන්තිය මගින් 104ඉ (1) අනු ව්‍යවස්ථාව ඉවත් කර පහත අනුව්‍යවස්ථාව ආදේශ කර ඇත:**<br><br>**104ඉ (1)** මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙක් සිටිය යුත්තේ ය. ඒ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු නියම සහ කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.<br><br>**20 වන සංශෝධනයෙහි 22 වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104උළ ව්‍යවස්ථාව ඉවත් කර ඇත:** | මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා පත් කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලබා ගැනීම තවදුරටත් අවශ්‍යතාවයක් නොවේ. මේ වූ කලී 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පැවැති තත්ත්වයම නැවත ප්‍රවේශ වීමකි.<br><br>104උළ ව්‍යවස්ථාව ඉවත් කිරීම යන්නෙන් අදහස් වන්නේ මැතිවරණයක් පැවැත්වීම හෝ ජනමත විචාරණයක් පැවැත්වීම සම්බන්ධ ඕනෑම නීතියක් බලාත්මක කිරීමට කොමිසම සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අපොහොසත් වීම හෝ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද උපදෙස් හෝ මාර්ගෝපදේශවලට අනුකූල වීමට අපොහොසත් වීම තවදුරටත් වරදක් සංස්ථාපනය නොකරන්නේය යන්නයි. |

| | | |
|---|---|---|
| (ආ) 104ආ ව්‍යවස්ථාවේ පිළිවෙලින් (4) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදය හෝ (5) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානයන් හෝ උපමාන සමග අනුකූලව කටයුතු කිරීමට, අපොහොසත්වන, යම් රජයේ නිලධරයකු, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති යම් වෙළඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක සේවා නියුක්තිකයකු සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන යම් සමාගමක් වරදකට වරදකරු වන අතර, වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුත්තේ ය.<br><br>(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත සෑම මහාධිකරණයකටම (1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාගකොට තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුත්තේ ය. | | |
| **ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල සම්බන්ධයෙන් වන බලපෑම** | | |
| **155අ (1)** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත පමණක් ජාතික පොලිස් කොමිෂන් සභාවට සාමාජිකයකු පත් කිරීමේ බලය ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබා දී ඇත<br><br>**155අ (4)** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය මත පමණක් ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබා දී ඇත | **20 වන සංශෝධනයෙහි 42 වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ (1) ව්‍යවස්ථාව මෙසේ සංශෝධනය කර ඇත:** ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හත්දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත ජාතික පොලිස් කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය.<br><br>**155අ (4) ව්‍යවස්ථාව** කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට, (...) හෝ ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස (...) අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය. | මෙමගින් ජාතික පොලිස් කොමිෂන් සභාව සම්බන්ධයෙන් අසීමිත බලයක් ජනාධිපතිවරයාට ලබා දෙන්නා සේම ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට මෙන්ම පොලිස් සේවයෙහි ස්වාධීනත්වයට ද ද එය අහිතකර ලෙස බලපෑ හැකිය.<br><br>ජාතික පොලිස් කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම සහ ඉවත් කිරීම සම්බන්ධයෙන් අදාල වන මෙම වගන්ති හරහා 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි |

| | | |
|---|---|---|
| **155ආ (5)** පොලිස්පතිවරයාට අදාළ යම් කාරණයක් සාකච්ඡා කිරීම සඳහා යෝජිත යම් රැස්වීමක් හැර, කොමිෂන් සභාවේ කවර වූ හෝ රැස්වීමකට පැමිණීමට ද සහභාගීවීමට ද පොලිස්පතිවරයාට හිමිකම ඇත්තේ ය. එකී රැස්වීම්වලදී ඡන්දය භාවිතා කිරීමට ඔහුට හිමිකම නොමැත්තේ ය. | **20 වන සංශෝධනයෙහි 43 වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ආ (5) ව්‍යවස්ථාව ඉවත් කර ඇත:** | පැවැති තත්ත්වයට ම නැවත ප්‍රවේශ වීමක් සිදුවේ.<br><br>ජාතික පොලිස් කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා පොලිස්පතිවරයාට සහභාගී වීමේ හැකියාව තවදුරටත් නොපවතී. |
| **155 ඇ** 126 වන ව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට සහ 155ඔ ව්‍යවස්ථාව මගින් පරිපාලනය අභියාචන විනිශ්චය අධිකාරය වෙත ප්‍රදානය කොට ඇති බලතලවලට කොමිෂන් සභාව යටත් වේ” | **20 වන සංශෝධනයෙහි 44 වන වගන්තිය මගින් මෙසේ සංශෝධනය කර ඇත:** කොමිෂන් සභාව වෙත එහි යම් කමිටුවක් වෙත්වා හෝ සාමාජිකයෙකු වෙත මේ පරිච්ඡේදය යටතේ හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ හෝ පවරා දී ඇති හෝ අනුව ඇති බලතල හෝ කාර්ය කිසිවක් ප්‍රකාර කොමිෂන් සභාව විසින් එවැනි යම් කමිටුවක් විසින් හෝ කොමිෂන් සභාවේ නැතහොත් ඒ කමිටුවේ යම් සාමාජිකයෙකු විසින් කරනු ලැබූ යම් නියමයක් වූ ගනු ලැබූ යම් තීරණයක් පරීක්ෂා කිරීමට ඔහු ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමට හෝ කවර වුවද ආකාරයකකින් ඒ ගැන ප්‍රශ්න කිරීම *126 වන ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට යටත්ව* කිසිදු අධිකරණයකට හෝ විනිශ්චය විනිශ්චයාධිකාරය ක ට බලය හෝ අධිකරණ බලය නො තිබිය යුත්තේය. | . |
| | **20 වන සංශෝධනයෙහි 46 වන වගන්තිය මගින් පහත නව ව්‍යවස්ථාව ඇතුලත් කර ඇත:**<br><br>**155ඊඊ ව්‍යවස්ථාව** පොලිස් නිලධරයකුට හෝ පොලිස් බලකායට එරෙහිව ජනතා සාමාජිකයන්ගෙන් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තුගෙන් හෝ ලැබෙන පැමිණිලි භාරගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවට බලතල ලබාදිය යුතු අතර, පාර්ලිමේන්තුව මගින් පනවන ලද යම් නීතියක විධිවිධානවලට අනුකූලව ඒ සම්බන්ධයෙන් සහන සැලසිය යුතු වන්නේ ය. මේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින්, ජනතා සාමාජිකන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්කුගෙන් ලැබෙන පැමිණිලි භාරගැනීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා කාර්ය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය හැකි වන්නේ ය.”. | මේ ව්‍යවස්ථාවේ විධිවිධානයන් මගින් පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය සහ පොලිස් නිලධාරීන් සේවයෙන් පහ කිරීම මෙන්ම කොමිෂන් සභාව විසින් පවරන ලද බලතල ප්‍රකාරව කමිටුවක හෝ නිලධරයෙකු විසින් සහ උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය සහ පොලිස් නිලධාරීන් සේවයෙන් පහ කිරීම ආදී වශයෙන් වූ නියෝගයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් වූ පොලිස් නිලධාරියෙකුට කොමිෂන් සභාවට අභියාචනය කිරීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව සතු බලතල ඉවත් කර තිබේ. |

| | | |
|---|---|---|
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ - 155ඔ දක්වා වූ ව්‍යවස්ථාවන් මගින් කොමිෂන් සභාවේ බලතල සහ කොමිෂන් සභාවේ තීරණයකට එරෙහිව අභියාචනය කිරීමේ අයිතිය බෙපන්වා දෙනු ලැබේ** | **20 වන සංශෝධනයෙහි 47-51 වන වගන්තීන් මගින් 155උ-155ඔ ව්‍යවස්ථාවන් ඉවත් කර ඇත:** | |
| **අධිකරණ සේවා කොමිෂන් සභාවේ බලතල කෙරෙහි බලපෑම** | | |
| **111 ඇ ව්‍යවස්ථාව මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය පෙන්වා දෙනු ලැබේ**<br><br>111 ඇ ව්‍යවස්ථාව<br>(1) අධිකරණ සේවා කොමිෂන් සභාවක් පැවතිය යුතු සේම එය අග්‍රවිනිශ්චයකාරවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයන් දෙදෙනාගෙන් සමන්විත විය යුත්තේ ය.<br><br>**(2) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයන් දෙදෙනා මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයෙකු ලෙස සේවයේ යෙදී සිටීමේ පළපුරුද්ද නොමැති තැනැත්තන් වන අවස්ථාවක දී කොමිෂන් සභාව, අග්‍රවිනිශ්චයකාරවරයා ගෙන් ද ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයාගෙන් ද සහ මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයකු ලෙස පළපුරුද්ද ලද එකී ශ්‍රේෂ්ඨාධිකරණයේ ඊළඟ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයාගෙන් සමන්විත විය යුත්තේ ය.**<br><br>(3) අග්‍රවිනිශ්චයකාරවරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.".<br><br>**අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම 111ඉ (6)** ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය සහිතව කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකු හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.". | **20 වන සංශෝධනයෙහි 25 වන වගන්තිය මගින් 111 ඇ ව්‍යවස්ථාව මෙසේ සංශෝධනය කර පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කර ඇත:**<br><br>111 ඇ ව්‍යවස්ථාව<br>(1) අධිකරණ සේවා කොමිෂන් සභාවක් පැවතිය යුතු සේම එය අග්‍රවිනිශ්චයකාරවරයාගෙන් සහ *ජනාධිපතිවරයා විසින්* පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ *වෙනත් විනිශ්චයකාරවරයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය.*<br>(2) අග්‍රවිනිශ්චයකාරවරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.".<br><br>**20 වන සංශෝධනයෙහි 26 වන වගන්තිය මගින් විධිවිධානය ඉවත් කර පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කර ඇත:**<br>**(6)** ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකු හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.". | 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ස්වකීය ජ්‍යෙෂ්ඨත්වය හෝ මුල් අවස්ථා අධිකරණයන් හි විනිශ්චයකාරවරයෙකු වශයෙන් සේවය කිරීම පිළිබඳව ඇති අධිකරණමය අත්දැකීම් පිළිබඳව සලකා බැලීම්කින් තොරව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයන් දෙදෙනෙකු අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් වශයෙන් පත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට පවතින අන්දමට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සැකසී තිබේ.<br><br>පාර්ලිමේන්තු සභාවේ අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවයකින් තොරව එවන් කොමිෂන් සභාවක සාමාජිකයන් පත් කිරීමේ සහ ඉවත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට පවතී.<br><br>මෙමගින් අධිකරණ සේවා කොමිෂන් සභාව සම්බන්ධයෙන් අසීමිත බලයක් ජනාධිපතිවරයාට ලබා දෙන්නා සේම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට මෙන්ම අධිකරණයේ ස්වාධීනත්වයට ද එය අහිතකර ලෙස බලපෑ හැකිය. තවද, කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම සඳහා පැවැති නිර්ණායකයන් ඉවත් කිරීම හරහා එකී පත්වීම් ලබාදීමේ ක්‍රියාවලියෙහි විනිවිදභාවය අඩුවීමක් සිදු වන්නා සේ ම එවන් වූ ආයතනයකට පත් කරනු ලබන පුද්ගලයන්ගේ නිසි සුදුසු භාවය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් ද මතු කරයි. |

| | | |
|---|---|---|
| | | අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම සහ ඉවත් කිරීම සම්බන්ධයෙන් අදාල වන මෙම වගන්ති හරහා 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි පැවැති තත්ත්වයට ම නැවත යොමු වීමක් සිදුවේ. |
| **අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව කෙරෙහි බලපෑම** | | |
| | **20 වන සංශෝධනයෙහි 54 වන වගන්තිය**<br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIXඅ වන පරිච්ඡේදය (156අ ව්‍යවස්ථාව) මෙයින් ඉවත් කරනු ලැබේ. | පාර්ලිමේන්තුව විසින් නව නීතියක් සම්මත කරන තුරු, වර්ෂ 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කිරීමේ කොමිෂන් සභා පනත සඳහා පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීම ඉවත් කෙරේ.<br><br>අනාගතයේ පත්වන ආණ්ඩුවකට පාර්ලිමේන්තුව තුළ සරල බහුතරයක් මගින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව අහෝසි කර දැමිය හැකිය.<br><br>18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීම් ලබා දී නොතිබිණි. |
| **විගණන සේවා කොමිෂන් සභාව කෙරෙහි බලපෑම** | | |
| **විගණකාධිපතිවරයා පත් කිරීම**<br>153 (1) **ව්‍යවස්ථාව** විගණකාධිපතිවරයෙක් වන්නේය. විගණකාධිපතිවරයා සුදුසුකම්ලත් විගණකවරයකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව පත්කරනු ලබන්නේ ය. විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටිනතාක් ස්වකීය ධුරය දරන්නේ ය.". | **20 වන සංශෝධනයෙහි 31 වන වගන්තිය මගින් මෙම විධිවිධානය ඉවත් කර පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කර ඇත:**<br>153 (1) **ව්‍යවස්ථාව** විගණකාධිපතිවරයෙක් වන්නේ ය. විගණකාධිපතිවරයා *ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය.* විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධුරය දරන්නේ ය. | වර්තමානයේ පවතින ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයා සුදුසුකම් ලැබූ විගණකවරයෙකු විය යුතු අතර ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත් පත් කරනු ලබයි. මෙම තත්ත්වය වෙනස් කරමින් ඕනෑම පුද්ගලයකු විගණකාධිපතිවරයා වශයෙන් පත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට ලැබෙන්නා වූ |

| | | |
|---|---|---|
| **154 (9) ව්‍යවස්ථාව මගින් පෙන්වා දෙන පරිදි 'සුදුසුකම්ලත්' යන්න සඳහා 154 (8) ව්‍යස්ථාවෙහි අර්ථ දැක්වීම 153 (1) ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන විගණකාධිපතිවරයාට අදාල වන බව සඳහන්වේ**<br><br>**153 (4) ව්‍යවස්ථාව** විගණකාධිපතිවරයාට සිය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට නොහැකි වූ විට විගණකාධිපතිවරයා වෙනුවෙන් වැඩ බැලීම සඳහා තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.".<br><br>153 අ - 153 උෟ යන ව්‍යවස්ථා මගින් විගණක සේවා කොමිෂන් සභාවේ සංයුතිය, රැස්වීම්, බලතල සහ කාර්තව්‍ය, නීති කෘත්‍ය වලින් මුක්තිය බව සහ සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු බව සඳහන් කෙරේ<br><br>**විගණකාධිපතිවරයාගේ බලතල 154 (1) ව්‍යවස්ථාව**<br><br>විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, *ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය*, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා*, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ *2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේ ය.* | **20 වන සංශෝධනයෙහි 40 වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (9) ව්‍යවස්ථාව ඉවත් කර ඇත:**<br><br>**153 (4) ව්‍යවස්ථාව** විගණකාධිපතිවරයාට සිය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට නොහැකි වූ විට විගණකාධිපතිවරයා වෙනුවෙන් වැඩ බැලීමට තැනැත්තකු *පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.*<br><br>**20 වන සංශෝධනයෙහි 32-39 වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 අ - 153 උෟ යන ව්‍යවස්ථ ඉවත් ඇත:**<br><br>**20 වන සංශෝධනයෙහි 40 වන වගන්තිය මගින් 154 (1) ව්‍යවස්ථාව ඉවත් කර පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කර ඇත:**<br>විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලුම දෙපාර්තමේන්තුවල ගිණුම් ද, අමාත්‍ය මණ්ඩලයේ කාර්යාලයේ, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ, *පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලවල*, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලයේ, පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලයේ සහ *මැතිවරණ කොමසාරිස් වරයාගේ කාර්යාලයේ*, පළාත් පාලන ආයතන කාර්යාලවල, රාජ්‍ය සංස්ථා කාර්යාලවල ගිණුම් ද සහ යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇති වෙළඳ ව්‍යාපාරවල හෝ වෙනත් ව්‍යාපාරවල ගිණුම් ද විගණනය කළ යුත්තේ ය. | ආකාරයට යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සකසා තිබේ. මෙමඟින් අදාළ පත් කිරීමේ විනිවිදභාවය පිළිබඳව මෙන්ම විගණකාධිපතිවරයා වශයෙන් අදාල තනතුරු දැරීමට එකී වූ පුද්ගලයාට ඇති සුදුසුකම් පිළිබඳව ද ගැටලුකාරී තත්වයන් ඉස්මතු කරයි.<br><br>විගනකාධිපති වරයෙකු පත් කිරීමේ දී පවතින අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් වන තත්වය මෙම වගන්තිය මගින් සංශෝධනය කෙරෙන අතර එය 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි පැවැති තත්ත්වයට ම නැවත ගෙන යාමකි.<br><br>විගණක සේවා කොමිෂන් සභාව සම්බන්ධයෙන් අදාල වන ව්‍යවස්ථාවන් ගත්කල ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වශයෙන් තිබූ සුරක්ෂිතතාවය ඉවත් කර ඇත. මෙය හුදෙක් 18 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි පැවැති තත්ත්වයම නැවත ඇති කිරීමකි.<br><br>ජනාධිපතිවරයාගේ ලේකම් කාර්යාලය සහ අග්‍රාමාත්‍යවරයාගේ ලේකම් කාර්යාලය යන ආයතන තවදුරටත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අවශ්‍යතාවයක් වශයෙන් විගණකාධිපතිවරයාගේ විගණනයට ලක් වීමේ අවශ්‍යතාවයක් නොමැති තත්ත්වයට පත්ව තිබේ.<br><br>මෙම තත්වය 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි පැවති තත්වයටම සමාන වේ. මේ ඔස්සේ අදාල ආයතනයන් සම්බන්ධයෙන් මහජනතාව වෙත පවතින විනිවිදභාවයෙහි සහ වගවීමේ තත්වය හීන කිරීමක් වේ. |

| රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල කෙරෙහි බලපෑම | | |
|---|---|---|
| **54. (1) ව්‍යවස්ථාව**<br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විය යුත්තේ ය. ඒ සාමාජිකයන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තාහ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය. | **20 වන සංශෝධනයෙහි 8 වන වගන්තිය මගින් මෙම ව්‍යවස්ථාව ඉවත් කර පහත පරිදි සංශෝධනය කර ඇත:**<br>"54 (1) ව්‍යවස්ථාව ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන නව දෙනකුට නොවැඩි සාමාජිකයන්ගෙන් සමන්විත (මේ පරිච්ඡේදයේ ,කොමිෂන් සභාව, යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විය යුතු අතර, එකී සාමාජිකයන් අතරින් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තා හ. ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුත්තේ ය." | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන්නා සේම පාර්ලිමේන්තු සභාවේ අනුමැතියකින් තොරව එකී සාමාජිකයන්ව ඉවත් කිරීමේ හැකියාව ද ජනාධිපතිවරයා සතු වේ. මේ තුළින් ජනාධිපතිවරයාට එකී කොමිෂන් සභාව සම්බන්ධයෙන් අසංවරණ බලතල (unchechked power) ලැබෙන්නා සේම එය අදාළ කොමිෂන් සභාවේ ස්වාධීනත්වයත්වයට ද අගතිගාමී ලෙස බලපානු ලැබිය හැක. |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය මත ජනාධිපතිවරයා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ඉවත් කල හැක්කේය. | **20 වන සංශෝධනයෙහි 8 වන වගන්තිය මගින් සාමාජිකයකු ඉවත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට පවරා ඇත** | මේ තුළින් රාජ්‍ය සේවාවෙහි ස්වාධීනත්වය අවතක්සේරු වීමට බලපෑහැකි තත්වයක් පවතී. |
| **56. (1) ව්‍යවස්ථාව**<br>*කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන* රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන (කොමිෂන් සභාවේ සාමාජිකයන් නොවන) තැනැත්තන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේය. | **20 වන සංශෝධනයෙහි 9 වන වගන්තිය මගින් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කර පහත පරිදි ඉදිරිපත් කර ඇත:**<br>**56. (1) ව්‍යවස්ථාව**<br>අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව නියම කරනු ලබන රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන (කොමිෂන් සභාවේ සාමාජිකයන් නොවන) තැනැත්තන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේය. | මෙම වගන්තිය හරහා සිදුව ඇත්තේ කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම සහ ඉවත් කිරීම සම්බන්ධයෙන් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ස්ථාවරය වෙත නැවත ප්‍රවේශ වීමකි. |
| | **20 වන සංශෝධනයෙහි 10 වන වගන්තිය මගින් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කර පහත පරිදි ඉදිරිපත් කර ඇත:** | |

| | | |
|---|---|---|
| **57. (1) ව්‍යවස්ථාව**<br><br>*කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන* රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොන්දේසි සහ කාර්ය පටිපාටිවලට යටත්ව කොමිෂන් සභාව විසින් රාජ්‍ය නිලධරයෙකුට පවරා දෙනු ලැබිය හැක්කේය.<br><br>**61අ. ව්‍යවස්ථාව.**<br><br>*59 වැනි ව්‍යවස්ථාවේ සහ 126 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව* කමිටුවක් විසින් හෝ යම් රජයේ නිලධරයකු විසින් මේ පරිච්ඡේදයේ යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ කොමිෂන් සභාව වෙත පැවරී ඇති හෝ පැනවී ඇති නැතහොත් කමිටුව වෙත රාජ්‍ය නිලධරයා වෙත පවරා දී ඇති යම් බලයක් හෝ කාර්යයක් ප්‍රකාර කරන ලද යම් නියමයක් හෝ තීරණයක් විභාග කිරීමට හෝ තීන්දුවක් දීමට හෝ කවර වූ හෝ ආකාරයකින් ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමට කිසිම අධිකරණයකට හෝ විනිශ්චය අධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොමැත්තේය | **57. (1) ව්‍යවස්ථාව**<br><br>*අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව නියම කරනු ලබන* රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොන්දේසි සහ කාර්ය පටිපාටිවලට යටත්ව කොමිෂන් සභාව විසින් රාජ්‍ය නිලධරයෙකුට පවරා දෙනු ලැබිය හැක්කේය.<br><br>**20 වන සංශෝධනයෙහි 11 වන වගන්තිය මගින් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කර පහත පරිදි ඉදිරිපත් කර ඇත:**<br>**61අ ව්‍යවස්ථාව**<br>*126 වැනි ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන, (4) වන සහ (5) වන ඡේදයන්හි විධිවිධානවලට යටත්ව* කමිටුවක් විසින් හෝ යම් රජයේ නිලධරයකු විසින් මේ පරිච්ඡේදයේ යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ කොමිෂන් සභාව වෙත පැවරී ඇති හෝ පැනවී ඇති නැතහොත් කමිටුව වෙත රාජ්‍ය නිලධරයා වෙත පවරා දී ඇති යම් බලයක් හෝ කාර්යයක් ප්‍රකාර කරන ලද යම් නියමයක් හෝ තීරණයක් විභාග කිරීමට හෝ තීන්දුවක් දීමට හෝ කවර වූ හෝ ආකාරයකින් ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමට කිසිම අධිකරණයකට හෝ විනිශ්චය අධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොමැත්තේය. | |
| **ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ බලතල සම්බන්ධයෙන් ඇති බලපෑම** | | |
| | **20 වන සංශෝධනයෙහි 55 වන වගන්තිය**<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIXආ පරිච්ඡේදය (156ආ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිට 156උෟ ව්‍යවස්ථාව දක්වා) මෙයින් ඉවත් කරනු ලැබේ. | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කරනු ලැබේ.<br><br>මෙම කොමිෂන් සභාවේ කාර්යය වන්නේ රජයේ ආයතන වල ප්‍රසම්පාදන කටයුතු සඳහා ''සාධාරණ, අපක්ෂපාතී, විනිවිදභාවයකින් යුත්, තරගකාරී සහ අරපිරිමැසුම්දායක ක්‍රියාපටිපාටින් සහ මාර්ගෝපදේශයන් සැකසීමය''. |

| | | |
|---|---|---|
| | | ප්‍රසම්පාදන කාර්ය පටිපාටීන් නිරික්ෂණය කිරීමට, වාර්තා කිරීමට සහ විමර්ශණය කිරීමට. |
| **අනෙකුත් වෙනස්කම්** | | |
| යම් තැනැත්තෙකු;<br>➢ වයස අවුරුදු 35 ට අඩු නම් ***[ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 (අ) ව්‍යවස්ථාව ]*** හෝ<br>➢ ද්විත්ව පුරවැසි යකු වේ නම් ***[ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 (ආ) ව්‍යවස්ථාව ]***<br>ජනාධිපති තනතුර සඳහා තෝරා පත්කර ගැනීමට නුසුදුසු වන්නේය. | **20 වන සංශෝධනයෙහි 18 වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 (අ) ව්‍යවස්ථාව සංශෝධනය කර ඇත:**<br>ඒ ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ "තිස්පහ" යන වචනය වෙනුවට "තිහ" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ | වයස අවුරුදු <u>**තිහට (30)**</u> ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට ජනාධිපතිවරණ මැතිවරණය සඳහා තරග කිරීමේ හැකියාව පවතී.<br>ද්විත්ව පුරවැසිභාවය සහිත තැනැත්තන් ජනාධිපතිවරණ මැතිවරණයකට තරග කිරීම සඳහා තවදුරටත් නුසුදුස්සන් බවට පත් නොවේ |
| | **20 වන සංශෝධනයෙහි 56 වන වගන්තිය**<br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව, එහි "රජයේ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ | මෙම නව නිර්වචනය අනුව පහත සඳහන් තනතුරු දරන්නන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් 170 වන ව්‍යවස්ථාව යටතේ සලකනු ලබන රජයේ නිලධරයන් යන යෙදුමෙහි අර්ථ නිරූපණයට තවදුරටත් අයත් නොවේ;<br>➢ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයන්<br>➢ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජිකයන්<br>➢ මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයන්<br>➢ සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් |

| | | |
|---|---|---|
| | | ➢ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්<br>➢ රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සාමාජිකයන්<br>➢ විගණකාධිපතිවරයා<br><br>මෙම නව නිර්වචනය අනුව පහත සඳහන් තනතුරු දරන්නන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් 170 වන ව්‍යවස්ථාව යටතේ සලකනු ලබන රජයේ නිලධරයන් යන යෙදුමෙහි අර්ථ නිරූපණයට ඇතුලත් කර ඇත;<br><br>➢ මැතිවරණ කොමිෂන් සභාවේ කොමසාරිස් ජනරාල්වරයා<br>➢ මැතිවරණ කොමිෂන් සභාව මගින් මැතිවරණ කොමිෂන් සභාවට පත් කරනු ලබන නිලධරයන්<br>➢ ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයෙකු |
| **අන්තර්කාලීන විධිවිධානයන්ගේ බලපෑම** | | |
| | **20 වන සංශෝධනයෙහි 57 (3) වන වගන්තිය**<br><br>මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී-<br><br>(අ) මැතිවරණ කොමිෂන් සභාවේ;<br><br>(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ;<br><br>(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ; | පාර්ලිමේන්තු සභාව විසින් නව සාමාජිකයන් පත්කල කල්හි මෙකී කොමිෂන් සභාවන්හි සාමාජිකයන් ස්වකීය සේවා කාලය අවසන් වීමට පෙර එකී නිලයන්හි කටයුතු කිරීම නතර කරනු ඇත. |

| | | |
|---|---|---|
| | (ඇ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ;<br><br>(ඉ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ;<br><br>(ඊ) මුදල් කොමිෂන් සභාවේ; සහ<br><br>(උ) සීමා නිර්ණය කොමිෂන් සභාවේ,<br><br>සභාපතිවරයා හෝ සාමාජිකයකු ලෙස ධුර දරන සෑම තැනැත්තකුම, **ඔහු කලින් ඉල්ලා අස්වූවහොත්, මිය ගියහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, VIIඅ පරිච්ඡේදයට අනුකූලව ඒ අදාළ කොමිෂන් සභා ස්ථාපිත කරනු ලබන දිනය තෙක්** තම අදාළ ධුරවල බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම දිගටම කරගෙන යනු ලැබිය යුත්තේ ය. | |